## ඩීඑෆ්සීසී බැංකුවේ ණයවරපත් භාවිතා කිරීම සඳහා කොන්දේසි

1. අර්ථ දැක්වීම්

1.1 "මෙම ගිවිසුම" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී සහ කාඩ්පත දරන්නා අතර ඇතිකරගනු ලබන ගිවිසුම වන අතර එහි දැක්වෙන කොන්දේසිවල නියමයන් කලින් කලට වෙනස් විය හැකි ය.

1.2 "පරිපූරක කාඩ්පත දරන්නා" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, මෙහි 9 වෙනි රීතිය යටතේ නම් කරන ලද තැනැත්තා වේ.

1.3 "බැංකුව" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ඩීඑෆ්සීසී පීඑල්සී වේ.

1.4 "කාඩ්පත" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, බැංකුව විසින් කාඩ්පත දරන්නා වෙත නිකුත් කරන ලද ණයවර කාඩ්පත වේ.

1.5 "කාඩ්පත් ගිණුම" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, කාඩ්පත් ගනුදෙනුව සම්බන්ධයෙන් බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම වේ.

1.6 "කාඩ්පත දරන්නා" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ගිවිසුම ප්‍රකාරව බැංකුව විසින් නිකුත් කරන ලද කාඩ්පත භාවිතා කරනු ලබන ඕනෑම පුද්ගලයෙකු සහ, එයට පරිපූරක කාඩ්පත දරන්නා ද ඇතුළත් වේ.

1.7 "කාඩ්පත් ගනුදෙනුව" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, කාඩ්පත භාවිතා කරමින් සිදුකරගෙන යනු ලබන ගනුදෙනුව හෝ ඒවා, කාඩ්පත් ගිණුම සහ/හෝ පුද්ගලික අනන්‍යතා අංකය (PIN) සහ හෝ කාඩ්පත් ගනුදෙනු සඳහා පහසුකම් සපයන වෙනත් ගෙවීම් මාර්ග යටතට ඇතුලත් වන හෝ අන්තර්ජාලය, ටෙලිබැන්කින්, ඇමතුම් ඇමතුම් බැන්කුකරණය, ඊ-වොලට් සහ වෙනත් ඕනෑම අන්තර්ජාල ගෙවීම් ද්වාරයක් (IPG) ලෙස අදාල කොන්දේසිවල විස්තර කර ඇති සහ කියාදී ඇති භාණ්ඩ, සේවාවන්/නිෂ්පාදන සහ/හෝ ප්‍රතිලාභ හෝ ඔබේ දැනුමතිව හෝ දැනුමින් තොරව හෝ යම්කිසි භාණ්ඩ, සේවාවන්/නිෂ්පාදන සහ/හෝ ප්‍රතිලාභ සඳහා ගෙවීමක් සහ යම් පුණ්‍ය කටයුත්තක් සඳහා සිදුකරනු ලබන ගෙවීමක් හෝ යම් මුදල් අත්තිකාරමක් වේ.

1.8 "මුදල් අත්තිකාරම" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) ජාලය හෝ ඩීඑෆ්සීසී බැංකුවේ ශාඛාවකින් ණයවර කාඩ්පත භාවිතා කරමින් මුදල් ආපසු ලබාගැනීමක් වේ'

1.9 "පවුලේ සමීප සාමාජිකයා" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, කලත්‍රයා හෝ කාඩ්පත දරන්නාගේ අවුරුදු 18 ට වැඩි දරුවන් හෝ කාඩ්පත දරන්නාගේ මව/පියා වේ.

1.10 "වෙළෙන්දා" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ණයවර කාඩ්පත භාරගනිමින් භාණ්ඩ හෝ සේවාවන් විකිණීමට බැංකුව විසින් පිළිගනු ලබන පුද්ගලයෙකු හෝ ආයතනයක් වේ.

1.11 "ණය සීමාව" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, කාඩ්පත් ගිණුමට හෝ ගිණුම්වලට අවසර දෙනු ලබන උපරිම හර ශේෂය වන අතර, එහිදී තීරණය කර ඇති සහ බැංකුව විසින් කලින් කලට ප්‍රාථමික කාඩ්පත දරන්නා වෙත දැනුම්දී ඇති පරිදි කාඩ්පත් ගිණුම් එකකට වැඩි ගණනක් සඳහා ඒකාබද්ධ ණය මුදලක් වෙන් කරනු ලැබේ.

1.12 "PIN" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, කාඩ්පත දරන්නා වෙත නිකුත් කරනු ලබන පුද්ගලික අනන්‍යතා අංකය වේ.

1.13 "ප්‍රාථමික කාඩ්පත දරන්නා" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, පවත්වාගෙන යනු ලබන කාඩ්පත් ගිණුමක නම සඳහන් පුද්ගලයෙකු සහ/හෝ පරිපූරක කාඩ්පත් එකක් හෝ වැඩි ගණනක් දරන්නන් පරිපූරක කාඩ්පත් දරන්නන් වෙත වෙත නිකුත් කරන ලෙස බැන්කුවෙන් ඉල්ලා ඇති පුද්ගලයෙකු වේ.

1.14 "ATM" යනුවෙන් අදහස් කරනු ලබන්නේ,ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් හෝ කාඩ්පත් මගින් ක්‍රියාත්මක වන අතර එය අප බැංකුවට හෝ වෙනත් සහභාගී බැංකුවලට හෝ මූල්‍ය ආයතනවලට හෝ වීසා

ලෝකව්‍යාප්ත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයට (Visa Global ATM Network) හෝ එහි අනුබද්ධ ජාලකයට අයත්විය හැකි අතර, ඒ සියල්ල විසින් කාඩ්පත භාරගනු ලැබේ.

1.15 ‘‘අපි, අපගේ සහ අපව’’ යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වේ.

1.16 ‘‘ඔබ, ඔබගේ, කාඩ්පත දරන්නා’’ යනුවෙන් අදහස් කරනු ලබන්නේ, කාඩ්පත නිකුත් කරනු ලබන පුද්ගලයා වන අතර, එයට ප්‍රාථමික කාඩ්පත දරන්නා සහ එක් එක් සහ සෑම පරිපූරක කාඩ්පත් දරන්නෙකුම බැන්කුවට අවශ්‍ය තැනදී ඇතුළත් වනු ඇත.

1.17 ‘‘ගෙවීමට නියමිත දිනය’’ යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ණයවර කාඩ්පත් ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි බැංකුව වෙත ගෙවිය යුතු මුළු මුදල හෝ අවම මුදල ගෙවීම සිදුකළ යුතු දිනය වේ.

1.18 ‘‘මාසික ප්‍රකාශන කාලපරිඡේදය’’ යනුවෙන් අදහස් කරනු ලබන්නේ, අවසාන ප්‍රකාශන බිල් කරනු ලැබූ දින සිට ඊළඟ ප්‍රකාශන බිල් කිරීම ආරම්භ කරන දින දක්වා කාල පරිච්චේදයයි.

1.19 මෙම ගිවිසුමෙහි දැක්වෙන මාතෘකා යොමුගත කිරීමේ පහසුව උදෙසා අප විසින් භාවිතා කරනු ලබන අතර, එහෙත් මෙම ගිවිසුම මාතෘකාවලට යොමුගත වෙමින් අර්ථ දැක්වීම සිදුනොකළ යුතු ය.

2. කාඩ්පත භාවිතා කිරීම

**2.1** කාඩ්පත ලද විගස එය කාඩ්පත දරන්නා විසින් අත්සන් කළ යුතු අතර එය භාවිතා කළ යුත්තේ,

**2.1.1** එකී කාඩ්පත දරන්නා විසිනි.

**2.1.2** වර්තමානවේ භාවිතා කරමින් සිටින කාලය තුළ බලපැවැත්වෙන මෙම ගිවිසුමේ දැක්වෙන **කොන්දේසි වලට** යටත්ව ය.

**2.1.3** ණය සීමාව තුළ (ණය සීමාවට ඉක්මවා ගිය යම් අමතර මුදලක් **ඇත්**නම් වහාම එය බැංකුව වෙත ගෙවිය යුතු ය) සහ ණය සීමාව ඉක්මවා ගොස් ඇතිවිට එය ගණනය කොට යම් කාඩ්පත් ගනුදෙනුවක් ඒ වනවිටත් කාඩ්පත් ගිණුමට හර වී නොමැති නම් සහ පෙරදිසි කාඩ්පත් ගනුදෙනුව සම්බන්ධයෙන් බැංකුව විසින් තුන්වන පාර්ශවයකට යම් අවසරයක් ලබාදී ඇතිවිට හෝ ඔබ විසින් කර ඇති ඉල්ලීමක් ලෙස ඉදිරියේදී සිදුකිරීමට නියමිත ගනුදෙනුවක් සඳහා අප විසින් යම් මුදලක් **ඔබේ කාඩ්පත් ගිණුමින් හර කර ඇති විටය.**

**2.1.4** කාඩ්පතෙහි මුද්‍රණය කර ඇති පරිදි වලංගු කාලය තුළ වේ.

3. කාඩ්පත

3.1 කාඩ්පත බැංකුව සතු දේපළක් වන අතර, බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන ඕනැම අවස්ථාවකදී එය කාඩ්පත දරන්නා විසින් බැංකුව වෙත ආපසු භාරදිය යුතු ය.

3.2 මෙම ගිවිසුම යටතේ කාඩ්පත දරන්නාගේ බැඳීම්වලට බලපෑ හැකි කිසිඳු කරුණක් නොමැතිව සහ තවදුරටත් අඛණ්ඩව බලපැවැත්වෙන පරිදි බැංකුව නිරපෙක්ශ අභිමතය පරිදි සහ පූර්ව දනුම්දීමකින් සහ හේතුවක් නොමැතිව ඕනැම වේලාවක කාඩ්පත සහ කාඩ්පත් හිමියාට කාඩ්පත භවිතා කිරීමට ලබාදී ඇති අයිතිය සම්පූර්නයෙන් හෝ විශේශිත පහසුකම් යටතේ කිරීමට හෝ නැවත නිකුත් කිරීමට හෝ වලන්ගු කාලය අලුත් කිරීමට හෝ ප්‍රතිස්තාපනය කිරීමට බැංකුවට අයිතියක් ඇත. යම් හෙයකින් කාඩ්පත දරන්නා විසින් සිය කාඩ්පත ස්වෙච්ඡාවෙන්ම ආපසු භාර දෙන්නේ නම්, කාඩ්පත දරන්නාගේ බැඳීම් සම්බන්ධයෙන් කාඩ්පත දරන්නා සෑහීමට පත්වන තුරු සහ එයාකාරයෙන්ම බැංකුව විසින් සෑහීමට පත්වන බවට සලකන තාක් කල් මෙම ගිවිසුම යටතේ දැක්වෙන බැඳීම් අඛණ්ඩව බලාත්මක වනු ඇත.

4. කාඩ්පත භාරදීම, එය භාවිතා කිරීම සහ පුද්ගලික අනන්‍යතා අංකය

4.1 කාඩ්පත නිකුත් කරනු ලබන පුද්ගලයා (''කාඩ්පත දරන්නා'') විසින් එය ලද වහාම එහි පසු පස අත්සන් කළ යුතු අතර, වෙනත් කිසිදු පුද්ගලයෙකුට එය භාවිතා කිරීමට අවසර නොදිය යුතු ය. තවද සෑම විටම එය සුරක්ෂිතව සහ කාඩ්පත දරන්නාගේ පුද්ගලික පාලනය යටතේ තබාගත යුතු ය.

4.2 කාඩ්පත, කාඩ්පත දරන්නා සහ පරිපූරක කාඩ්පතදරන්නා/දරන්නන් වෙත ජවදූතයෙකු (courier) මගින් ලැබෙන්නට සලස්වනු ලබන අවස්ථාවක, කාඩ්පත දරන්නා/කාඩ්පත් දරන්නන් සහ පරිපූරක කාඩ්පත දරන්නා/පරිපූරක කාඩ්පත් දරන්නන් විසින් කාඩ්පත/කාඩ්පත් ලද වහාම එය ලැබුණු බවට සිය අනන්‍යතාවය ඉදිරිපත් කරමින් සනාථ කළ යුතු ය. කාඩ්පත දරන්නාගේ අභිමතය පරිදි ලිඛිතව නම් කරනු ලබන තුන්වන පාර්ශවයක් මගින් කාඩ්පත/කාඩ්පත් ඔහු/ඇය වෙනුවෙන් භාරගත හැකි අතර, ඒ වෙනුවෙන් දැරීමට සිදුවන සියලුම ගාස්තු ගෙවීම් සඳහා කලින් කලට කාඩ්පත දරන්නා/පරිපූරක කාඩ්පත දරන්නා හෝ ඔහු වෙනුවෙන් බලය පවරනු ලබන පුද්ගලයා වගකිව යුතු ය.කාඩ්පත, බැංකුවේ අභිමතය පරිදි බැංකුව විසින් තීරණය කරනු ලබන තුන්වන පාර්ශවයකට හෝ කාඩ්පත දරන්නාගේ නියෝජිතයෙකු වශයෙන් එහි නියෝජිතයෙකුට භාරදිය හැකි ය. කාඩ්පත එසේ භාරදීම වෙනුවෙන් කාඩ්පත මත කලින් කලට කිරීමට සිදුවන සියලුම ගාස්තු ගෙවීම් වෙනුවෙන් කාඩ්පත දරන්නා/පරිපූරක කාඩ්පත දරන්නා වගකිවය යුතු ය.

4.3 පුද්ගලික අනන්‍යතා අංකය (PIN), බැංකුවේදී, කාඩ්පත දරන්නාගේ/දරන්නන්ගේ ලිඛිත ඉල්ලීම පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ බැංකුවේ අභිමතය පරිදි ජවදූත සේවාවක් (courier service) මගින් කාඩ්පත දරන්නා/පරිපූරක කාඩ්පත දරන්නා/දරන්නන් වෙත ලැබෙන්නට සලස්වනු ඇත. කාඩ්පත, කාඩ්පත දරන්නා/පරිපූරක කාඩ්පත දරන්නන් වෙත ලැබුණු බවට දැන්වීමක් තැපැල් දෙපාර්තමේන්තුවෙන් හෝ ජවදූත සේවාවෙන් (courier service) යම් සාධාරණ කාලසීමාවක් තුළ බැංකුවට නොලැබුණ හොත් එය ඔහු/ඇය විසින් භාරගනු ලැබූ බවට (අවශ්‍ය පරිදි) බැංකුව විසින් සලකනු ඇත. පුද්ගලික අනන්‍යතා අංකය කාඩ්පත දරන්නාට/පරිපූරක කාඩ්පත දරන්නාට/දරන්නන්ට ලැබුණු පසුව එය ඔහු/ඇය සතු දේපළක් වන අතර, එය කාඩ්පත දරන්නා/පරිපූරක කාඩ්පත දරන්නා/දරන්නන් සන්තකයේ සුරක්ෂිතව පවතින බවටත් කිසිදු ආකාරයකින් අන් අයට දැනගැනීමට ඉඩ නොතැබීමටත් අවශ්‍ය සියලු පූර්වෝපායන් ගැනීමට කාඩ්පත දරන්නා/පරිපූරක කාඩ්පත දරන්නා/දරන්නන් විසින් වගබලා ගත යුතු ය.

4.4 ඕනෑම ආරවුල්සහගත ගණුදෙනුවක වටිනාකම සහ ඒ සම්බන්ද ඕනෑම ගාස්තුවක් කාඩ්පත් හිමියා/පරිපූරක කාඩ්පත් හිමියා (න්) විසින් ගණුදෙනුව සිදුකර ඇති බවට බැංකුවට සාදාරණ සාක්ෂි තිබේනම්, කාඩ්පත් හිමියා/පරිපූරක කාඩ්පත් හිමියා (න්) ගෙන් අයකර ගැනීමට බැන්කුවට අයිතියක් ඇත.

4.5 කාඩ්පත, බැංකුවේ කීර්තිනාමයට හානි ගෙනදිය හැකි කිසිඳු නීතිවිරෝධී හෝ අනවසර ගනුදෙනුවක සඳහා භාවිතා නොකළ යුතු අතර, එවැන්නක් සිදුකළ හොත් ඊට එරෙහිව එකී ශ්‍රී ලංකා ජනරජයේ නීතිවලට (මුදල් විශුද්ධිකරණ නීති, අනිකුත් නීති, රෙගුලාසි සහ අතුරු නීති ද ඇතුළුව) අනුකූලව කටයුතු කරනු ඇත.

5. ණය සීමාවන්

5.1 ණය සීමාවන්

5.1.1 කාඩ්පත් ගිණුම සඳහා ණය සිමාවක් බැංකුවේ දැඩි අධීක්ෂණය යටතේ බැංකුව විසින් නියම කරනු ඇති අතර, එය නිතිමතින් නිරීක්ෂණය කළ යුතු ය. කෙසේ වෙතත්, බැංකුවේ අභිමතය පරිදි බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන ලේඛන ලබාදීමෙන් පසුව ඕනෑම අවස්ථාවකදී තමාගේ ණය සීමාව සමාලෝචනය කිරීමට කාඩ්පත දරන්නා විසින් ඉල්ලුම් කළ හැකි ය.

5.1.2 ණය සීමාව ඉක්මවා ගොස් ඇති**බව** එය ගණනය **කිරීමේදී** යම් කාඩ්පත් ගනුදෙනුවක් ඒ වනවිටත් කාඩ්පත් ගිණුමට හර වී නොමැති නම් සහ පෙරදිසි කාඩ්පත් ගනුදෙනුව සම්බන්ධයෙන් බැංකුව විසින් තුන්වන පාර්ශවයකට යම් අවසරයක් ලබාදී ඇතිවිට ගිණුම සහ ගිණුමේ ශේෂය හෝ කාඩ්පත දරන්නා විසින් කර ඇති ඉල්ලීමක් ලෙස ඉදිරියේදී සිදුකිරීමට නියමිත ගනුදෙනුවක් සඳහා බැංකුව විසින් යම් මුදලක් **වෙන්** කර **ඇති අවස්ථා සලකිල්ලට ගනු ලැබේ**.

5.1.3 ණයවර කාඩ්පත වෙනුවෙන් බැංකුව විසින් ලබාදී ඇති සියලුම ණය පහසුකම් ඊට අදාල ගාස්තු ගෙවීම්, එතෙකුදු වුවත් මෙහි පහත දැක්වෙන පරිදි මෙම ගිවිසුම අවසන් කිරීම යන සියල්ල වෙනුවෙන් කාඩ්පත දරන්නා වගකිව යුතු ය.

5.2 ඒකාබද්ධ ණය සීමාව

5.2.1 ඒකාබද්ධ ණය සීමාව විය යුත්තේ කාඩ්පත දරන්නා විසින් කාඩ්පත් එකක වඩා වැඩි ගණනක් භාවිතා කරන්නේ නම් එකී සියලුම කාඩ්පත්වල ජංගම ශේෂයන් සඳහා අවසර දෙනු ලබන උපරිමය වන අතර, ඒ සඳහා ඒකාබද්ධ කාඩ්පත් ගිණුම් බවට පත්වීමට නම් බැංකුව විසින් ලිඛිතව උපදෙස් දිය යුතු ය.

5.2.2 වර්ථමාන ශේෂය යනුවෙන් අදහස් කරනු ලබන්නේ, සියලුම කාඩ්පත් ගනුදෙනු, පොලී මුදල්, ගාස්තු ගෙවීම්, අයවීම්, පිරිවැය සහ වියදම් (නෛතික වියදම්ද ඇතුළුව) තථ්‍ය හෝ අසම්භාව්‍ය වුවත් සහ මේ අවස්ථාවේදී හෝ අනාගතයේදී දැරීමට සිදුවන වියදම්ද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී, දෙන ලද ඕනෑම කාලයකදී කාඩ්පත් ගිණුම/ගිණුම් සහ/හෝ මෙම ගිවිසුම සම්බන්ධයෙන් කාඩ්පත දරන්නාගේ හිඟව පවතින සහ ඔහුගෙන්/ඇයගෙන් බැංකුව වෙත ගෙවිය යුතු මුළු වගකීම් වේ.

5.2.3 15.2 වගන්තියට යටත්ව කිසිඳු අවස්ථාවක ඒකාබද්ධ ණය ශේෂය, වර්තමාන ශේෂය ඉක්මවා යන සේ කාඩ්පත දරන්නා විසින් කාඩ්පත/කාඩ්පත භාවිතා නොකළ යුතු ය.

5.2.4 ඒකාබද්ධ ණය ශේෂය ඉක්මවා ගොස් ඇත්ද යන්න ගණනය කිරීමේදී, සිදුකර ඇති සහ කාඩ්පත් ගිණුමට හර නොවී ඇති ගනුදෙනුවක් හෝ බැංකුව විසින් යම් තුන්වෙනි පාර්ශවයකට අවසර දී ඇති යම් යෝජිත කාඩ්පත් ගනුදෙනුවක් හෝ කාඩ්පත දරන්නා විසින් කර ඇති ඉල්ලීමක් මත අනාගතයේදී සිදුකිරීමට නියමිත ගනුදෙනුවක් සඳහා බැංකුව විසින් වෙන් කර ඇති යම් මුදලක් යන කරුණු බැංකුව විසින් සැලකිල්ලට ගනු ඇත.

5.2.5 පූර්ව අවසරයක් ඇතිව හෝ නොමැතිව කාඩ්පත දරන්නා විසින් ඒකාබද්ධ ණය සීමාව ඉක්මවා යන පරිදි යම් කාඩ්පත් ගනුදෙනුවක් සිදුකරන්නේ නම්, ඒ පිළිබඳව ඕනෑම අර්ථයකින් බැංකුවට යෝග්‍ය යැයි සලකනු ලබන ආකාරයකින් බැංකුවේ අභිමතය පරිදි නියම කරනු ලබන සහ ඒ සම්බන්ධයෙන් සන්නිවේදනය කරනු ලබන පරිදි ඒකාබද්ධ ණය සීමාව ඉක්මවා යනු ලබන මුදල කාඩ්පත දරන්නා විසින් ඉක්මනින්ම ගෙවිය යුතු ය. කාඩ්පත දරන්නා මෙම අවශ්‍යතාවයට අනුකූලවීමට අපොහොසත් වන්නේ නම්, බැංකුවේ අයිතීන්ට හෝ එහි පිළියම්වලට අගති රහිතව කාඩ්පත දරන්නා වෙත කිසිඳු දැනුම්දීමකින් තොරව කාඩ්පත් ගිණුම වහාම අවසන් කිරීමේ අයිතිය බැංකුව සතු වේ.

6. බිල්පත් සැකසීම සහ ගෙවීම්

6.1 ඒ ඒ බිල්පත් කාලපරිඡේදය (“බිල්පත් කාලපරිඡේදය”) අවසානයේදී කාඩ්පත් ගිණුමෙහි සඳහන් මුළු හිඟ මුදල (“මුළු හිඟ මුදල”) සහ ගෙවිය යුතු අවම මුදල දැක්වෙන විස්තර සහිතව ගිණුම් ප්‍රකාශන දිනය (“ගිණුම් ප්‍රකාශන දිනය”), මුළු හිඟ මුදල වෙනුවෙන්බැංකුව වෙත ගෙවීම සිදුකළ යුතු දිනය (“ගෙවීම සිදුකළ යුතු දිනය”) සහ වර්තමාන බිල්පත් කාලපරිඡේදය සඳහා කාඩ්පත දරන්නා විසින් “ගෙවිය යුතු අවම මුදල”අතුළත් ගිණුම් ප්‍රකාශනයක් කාඩ්පත දරන්නා වෙත සාමාන්‍ය පරිදි යවනු ඇත.ගෙවිය යුතු අවම මුදල, මුළු හිඟ මුදලින් 5% ක ප්‍රමාණයක් හෝ ශ්‍රී ලංකා රුපියල් 250/- ක් යන දෙකින් වඩා වැඩි මුදල හෝ මුළු හිඟ

මුදල කාඩ්පත දරන්නාගේ ණය සීමාව ඉක්මවා ගොස් ඇත්නම්, ණය සීමාවෙන් 5% ක ප්‍රමාණයක් සමඟ මුළු හිඟ මුදල මගින් ණය සීමාව ඉක්මවා යනු ලැබුවේ කිනම් මුදලකින්ද එකී මුදල සමඟ ගෙවිය යුතු ය. මුළු අවම ගෙවීමට, පූර්ව බිල්පත් සැකසීමේ කාලපරිච්ඡේදයට/කාලපරිච්ඡේදවලට අදාළ නොගෙවන ලද ගෙවිය යුතු අවම ගෙවීම/ගෙවීම්ද ඇතුළත් වේ. බැංකුව වෙත සිදුකරනු ලබන ඕනෑම ගෙවීමක් බලාත්මක වන්නේ එකී ගෙවීම බැංකුව විසින් දැනුම්දී ඇති ලිපිනයට ලැබනු පසුව සහ එය කාඩ්පත් ගිණුමට බැර වූ පසුව ය. මුදලින් සිදුකරනු ලබන ගෙවීම් පිරිසැකසීම සඳහා අවම වශයෙන් එක් වැඩකරන දිනක්වත් අවශ්‍ය වන අතර, චෙක්පත් මගින් සිදුකරනු ලබන ගෙවීම් කාඩ්පත් ගිණුමට බැර වන්නේ ඒවා නිශ්කාශනය වූ පසුව ය.

6.2 කාඩ්පත් ගිණුමක් වෙනුවෙන් කාඩ්පත දරන්නා විසින් සිදුකරනු ලබන ගෙවීමක් මෙම කොන්දේසි සහ නියමයන් යටතේ බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි කාඩ්පත දරන්නාගේ වගකීම්වල ගෙවීම් හෝ ඒ වෙනුවෙන් සිදුකරනු ලබන ගෙවීම් සඳහා අදාල කරගනු ඇත.

6.3 මෙම ගිවිසුම යටතේ හිඟව පවතිව සියලුම මුදල් ගෙවිය යුත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි. කිසියම් ගෙවීමක් ශ්‍රී ලංකා රුපියල්වලින් හැර වෙනත් මුදලකින් බැංකුව වෙත සිදුකල හොත් අපගේ සාමාන්‍ය පිළිවත සහ පරම අභිමතය පරිදි එකී මුදල එම අවස්ථාවේ බලාත්මකව පවතින විනිමය අනුපාතවලට අනුව ශ්‍රී ලංකා රුපියල් බවට මාරු කරනු ලැබේ. එවැනි අවස්ථාවකදී සිදුවිය හැකි විනිමය අවදානම්, පාඩු, කොමිස් මුදල්, ගෙවීම් ගාස්තු ආදී සියල්ල කාඩ්පත දරන්නා/දරන්නන් විසින් දැරිය යුතු ය.

6.4 මෙම ගිවිසුම ප්‍රකාරව, ශ්‍රී ලංකාව තුළ සිදුකරනු ලබන කාඩ්පත් ගනුදෙනුවක් වෙනුවෙන් වන යම් මුදල් ආපසු දීමක් හෝ කාඩ්පත දරන්නා වෙත ගෙවිය යුතු වෙනත් අයවීම් සාමාන්‍ය පිළිවෙතට අනුකූලව එවැනි මුදල් ආපසු දීමක්, ගෙවීමක් හෝ අයවීම් ලැබීමෙන් පසුව සහ අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා රුපියල්වලට මාරු කොට කාඩ්පත් ගිණුමට බැර කරනු ඇත. එහෙත් එවැන්නක් සිදුවනු ඇත්තේ බැංකුව විසින් තීරණය කළහොත් හෝ වෙනත් හැටියකින් මිසක ජංගම ශේෂයේ පූර්ණ හෝ භාගික වගකීමෙන් නිදහස්වීම වෙත අදාල විය යුතු බැවින් එතෙක් එකී මුදල් කාඩ්පත දරන්නා වෙත ප්‍රේෂණය නොකරනු ඇත.

6.5

6.5.1 කාඩ්පත දරන්නා විසින් බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුමෙන් (නම්කළ පියවීම් ගිණුම), කාඩ්පත දරන්නාගේ හිඟව පවතින ණයවර කාඩ්පත් බිලෙහි සඳහන් මුදලින් යම් ප්‍රතිශතයකට සමාන මුදලක්, ගෙවීම සිදුකළ යුතු දිනට කාඩ්පත් ගිණුමට බැරවන පරිදි ඍජු ලිඛිත ස්ථාවර උපදෙස් නිකුත් කළ හැකි ය.

6.5.2 එවැනි ස්ථාවර උපදෙස්වල යම් සංශෝධනයක් සිදුකරන්නේ නම් සහ/හෝ එය අවලංගු කරන්නේ නම් එවැන්නක් ඊළඟ ගෙවීම සිදුකළ යුතු දිනට අවම වශයෙන් සති දෙකකටවත් පෙර බැංකුව වෙත ලැබිය යුතු බවට කාඩ්පත දරන්නා එකඟ වේ.

6.5.3 බැංකුවේ පවත්වාගෙන යනු ලබන නම්කළ පියවීම් ගිණුමෙන් මුදල් හර කිරීම පිණිස ඍජු හර ස්ථාවර උපදෙස් නිකුත් කිරීමේදී පහත දැක්වෙන අතිරේක කොන්දේසි සහ නියමය් අදාල වනු ඇත.

6.5.4 චෙක්පත් මගින් ඉදිරිපත් කරනු ලබන එවැනි ස්ථාවර උපදෙස් හෝ බැංකුව සමඟ සිදුකරනු ලබන යම් වෙනත් විධිවිධානයක ප්‍රමුඛතාවය තීරණය කිරීමේ අයිතිය බැංකුව සතු වන බවට කාඩ්පත දරන්නා එකඟ වේ.

6.5.5 ගෙවීම සිදුකළ යුතු දිනට පෙර දින වනවිට ස්ථාවර උපදෙස් මගින් ලබාදී ඇති මුදල නම්කළ පියවීම් ගිණුමෙහි තිබිය යුතු ප්‍රමාණවත් මුදල් ගණනක් සැපයීමට කාඩ්පත දරන්නා එකඟ වේ. යම් හෙයකින් පියවීම් ගිණුමෙහි ප්‍රමාණවත් මුදලක් නොමැති නම්, ස්ථාවර උපදෙස් මගින් නියම කර ඇති ගෙවිය යුතු මුදල ආවරණය කිරීම පිණිස බැංකුවේ අභිමතය පරිදි බැංකුව විසින් කලින් කලට බැංකු අයිරා ප්‍රදානය කරනු ඇති බවට කාඩ්පත දරන්නා විසින් පිළිගෙන එකඟ වේ. බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන අනුපාතයකට අනුව උපචිත වන සියලුම අදාල ගාස්තු ගෙවීම්, අයවීම් සහ මුල්‍ය ගාස්තුද අතුළත් බදු අයකර ගැනීම්ද ඇතුළුව හිඟව පවතින සියලුම මුදල් නැවත ගෙවන ලෙසට බැංකුව විසින් කාඩ්පත දරන්නාගෙන් ඉල්ලා සිටිය හැකි ය.

6.5.6 බැංකුවේ පවත්වාගෙන යනු ලබන නම්කළ පියවීම් ගිණුමට දෙන ලද සෘජු හර ස්ථාවර උපදෙස් ගණනය කිරීමේදී ගිණුම් ප්‍රකාශන දිනය සහ, ගෙවීම සිදුකළ යුතු දිනය අතර සිදුකරන ලද සියලුම අතුරු ගෙවීම් බැංකුව විසින් සැලකිල්ලට ගන්නා බවට කාඩ්පත දරන්නා එකඟ වේ.

6.5.7 නම්කළ පියවීම් ගිණුමෙහි ප්‍රමාණවත් මුදලක් නොපවතින්නේ නම් කාඩ්පත දරන්නා වෙත දැනුම්දීමක් කර නොකර ස්ථාවර නියෝගය අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතු වේ.

6.6 ශ්‍රී ලංකා රුපියල්වලින් හැර වෙනත් මුදල් වර්ගයකින් සිදුකරනු ලබන කාඩ්පත් ගනුදෙනුවලදී ඒවා කාඩ්පත් ගිණුමට හර කරනු ලබන්නේ එකී මුදල් වර්ගය බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි පවත්නා අනුපාතවලට අනුව ශ්‍රී ලංකා රුපියල්වලට මාරුකොට, එකී මුදල් මාරු කරනු ලබන දිනදී ය. එහිදී හටගත හැකි සියලුම විනිමය අවදානම්, පාඩු, කොමිස් මුදල්, ගෙවීම් සහ ගාස්තු ආදිය කාඩ්පත දරන්නා/දරන්නන් විසින් දැරිය යුතු ය.

6.7 ආරවුල්සහගත ගනුදෙනුවක් හේතුකොට ගෙන සිදුකරනු ලබන මුදල්ආපසු ලබාදීම හෝ ප්‍රතිවර්තනය කිරීමද ඇතුළුව ගනුදෙනුවක් අවලංගු කිරීම, ප්‍රතිවර්තනය කිරීම හෝ මුදල් ආපසුදීම හේතුකොට ගෙන සිදුවිය හැකි යම් විනිමය පාඩුවක් වෙනුවෙන් කාඩ්පත දරන්නා වගකිව යුතු ය.

6.8 නීති ප්‍රකාරව සිදුකළ යුතු යම් අඩුකර ගැනීමක් හෝ රඳවා ගැනීමක් (හිලව් කිරීමක්, පිළියැදුමක්, බදු හෝ වෙනත් හැටියකින් කොයික වුවක්) හැර මෙම ගිවිසුම යටතේ ගෙවිය යුතු සියලුම මුදල් කිසිදු අඩුකිරීමක් හෝ රඳවාගැනීමක් සිදුනොකර කාඩ්පත දරන්නා විසින් සම්පූර්ණයෙන්ම ගෙවා නිමකළ යුතු ය. අඩුකිරීමක් හෝ රඳවාගැනීමක් නීති ප්‍රකාරව සිදුකළ යුතු නම්, ඉක්මනින්ම ඔබ විසින් අප වෙත අමතර මුදලක් ගෙවිය යුතු අතර, එසේ කිරීමෙන් අප වෙත ලැබිය යුතු සම්පූර්ණ මුදලට සමාන මුදලක් ලැබී ඇති හෙයින් එවැනි අඩුකිරීමක් හෝ රඳවාගැනීමක් සිදුනොකර ඇති බවට අදහස් කෙරේ. තවද, එසේ මුදල් අඩුකරගනු ලැබූ හෝ රඳවාගනු ලැබූ සියලුම මුදල් වෙනුවෙන් අදාල අධිකාරිය විසින් නිකුත් කරන ලද නිල ලදුපතක් අප වෙත සැපයිය යුතු ය.

6.9 ගිවිසුමේ අනිකුත් ප්‍රතිපාදනවලට අගති රහිතව, කාඩ්පත දරන්නා මාසයකට වැඩි කාලසීමාවක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමට අදහස් කරන්නේ නම්, කාඩ්පත් ගිණුම පියවීම සඳහා අවශ්‍ය කරනු ලබන පැහැදිළි සහ විශේෂිත ලිඛිත උපදෙස් කාඩ්පත දරන්නා විසින් සිය පිටත්වීමට පෙර බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ලබාදිය යුතු ය. කාඩ්පත දරන්නා විසින් ඉහත සඳහන් කළ ආකාරයට නිසි පරිදි දැනුම්දී නොමැති නම් බැංකුවේ අභිමතය පරිදි කාඩ්පත අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතු වේ.

6.10 කාඩ්පත් ගිණුම වෙනුවෙන් නිකුත් කර ඇති එක් එක් ගිණුම් ප්‍රකාශය කාඩ්පත දරන්නා විසින් පරීක්ෂා කළ යුතු අතර එහි යම්කිසි දෝෂයක් පවතින්නේ නම් ඒ බැව් ගිණුම් ප්‍රකාශයේ දින සිට දින විස්සක් (20) ඇතුළත බැංකුව වෙත ලිඛිතව දැනුම්දිය යුතු ය. එකී කාලසීමාවෙන් පසුව (ඉහත ආකාරයෙන් දැනුම් දී ඇති කළායි කියන යම් දෝෂයක් හැර) එකී ගිණුම් ප්‍රකාශය සහ එහි දැක්වෙන සටහන් නිශ්චිත වශයෙන්ම නිවැරදි යැයි බැංකුව සහ කාඩ්පත දරන්නා විසින් සලකනු ලැබේ. කාඩ්පත දරන්නා විසින් ඉල්ලා සිටිනු ලබන විටකදී මිස සියලුම ගිණුම් ප්‍රකාශ කාඩ්පත දරන්නා විසින් බැංකුව වෙත අවසන් වරට ලිඛිතව ලබාදී ඇති ලිපිනයට සාමාන්‍ය තැපෑලෙන් යවනු ඇති අතර ඒවා තැපැල් කළ අවස්ථාවේ සිට පැය හැත්තෑ දෙකක් (72) ඇතුළත කාඩ්පත දරන්නා වෙත ලැබුණා යැයි සලකනු ඇත. ගිණුම් ප්‍රකාශ, කාඩ්පත දරන්නා විසින් බැංකුව වෙත නියම කොට ලබාදී ඇති විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයකට යවන ලෙස ඉල්ලා සිටිමටද කාඩ්පත දරන්නාට හැකි අතර, එසේ ලබාදෙන විද්‍යුත් තැපැල් ලිපිනයට එකී ගිණුම් ප්‍රකාශ බැංකුවේ විදුත් තැපැල් සේවා සපයනු ලබන සේවාදායකයෙන් (මේල් සර්වර්) නිකුත් වූ පසුව එය කාඩ්පත දරන්නා වෙත ලැබුණු බවට බැංකුව විසින් සලකනු ඇත. කෙසේ වෙතත් ගිණුම් ප්‍රකාශ විද්‍යුත් තැපෑල ඔස්සේ යැවීමේදී ඒවායෙහි අඩංගු තොරතුරු අතරමඟදී නැවතීමට (intercept), වැරදීමට, නැතිවීමට, විනාශවීමට, ප්‍රමාදවී හෝ අසම්පූර්ණ ලෙස පැමිණීමට හෝ ඒවායෙහි පරිගණක වෛරස් අඩංගුවීමට ඉඩ ඇති හෙයින් විද්‍යුත් තැපැල් සම්ප්‍රේෂණය ආරක්ෂිත හෝ දෝෂ රහිත වන බවට සහතික විය නොහැකි බවට කාඩ්පත දරන්නා විසින් විශේෂකොට ගෙන තේරුම් ගෙන, එකඟ වී පිළිගන්නා අතර, එසේ හෙයින් විද්‍යුත් තැපැල් සම්ප්‍රේෂණය

කිරීම හේතුකොට ගෙන විද්‍යුත් තැපැල් පණිවිඩයේ අඩංගුවිය හැකි යම් දෝෂ හෝ ප්‍රමාදදෝෂ වෙනුවෙන් වගකීමක් බැංකුව විසින් භාරනොගනු ඇත.

6.11 ගිණුම් ප්‍රකාශයක් නොලැබීම යනු ගෙවීම් සිදුනොකිරීමට දිය හැකි වලංගු හේතුවක් ලෙස සලකනු නොලැබේ. ගිණුම් ප්‍රකාශය පිළියෙල කළ දින සිට දින දාහතරක් (14) ඇතුළත හෝ යම් හෙයකින් අලුත් කාඩ්පතක් නම් එය අනුමත කළ දින සිට දින දාහතරක් (14) ඇතුළත කාඩ්පත දරන්නා වෙත නොලැබුණහොත් ඒ බැව් කාඩ්පත දරන්නා විසින් බැංකුව වෙත දැනුම්දිය යුතු ය.

7. ප්‍රත්‍යාවර්තීවීම් / වාරික ගෙවීම් (Recurring / Instalment Payments)

කාඩ්පත මත ණය (Loan on Card - LOC), කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්ම (Card Flexi Plan- CFP), කාඩ්පත් ශේෂය මාරු කිරීම (Card Balance transfer - CBT) යන බැංකුවේ වාරික සැලසුම්, එකී එක් එක් වාරික සැලසුම්වලට අදාල විශේෂ කොන්දේසි සහ නියමයන් කාඩ්පත දරන්නා විසින් පිළිගැනීමට යටත්ව කාඩ්පත දරන්නා විසින් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මත බැංකුවේ අභිමතය පරිදි කාඩ්පත දරන්නා වෙත ප්‍රදානය කරනු ලබන එවැනි එක් එක් වාරික සැලසුම්වලට අදාල වැඩටහන් විශේෂ කොන්දේසි සහ නියමයන්ට යටත් වේ.

7.1 කාඩ්පත මත ණය (Loan on Card - LOC)

7.1.1 කාඩ්පත මත ණය (“LOC Facility”) පහසුකම් මගින් කාඩ්පත දරන්නාට සිය කාඩ්පත භාවිතා කරමින් මුදල් අත්තිකාරම් ලබාගැනීමට ඉඩ ලබාදී ඇති අතර, එය මාස 6 ක්, 12 ක් හෝ 24 ක් තුළ සමාන වාරිකවලින් ආපසු ගෙවිය හැකි ය.

7.1.2 කාඩ්පත මත ණය (“LOC Facility”) පහසුකම මගින් ලබාගත හැකි අවම අත්තිකාරම් මුදල රු. 10,000/- වන අතර, ලබාගත හැකි උපරිම අත්තිකාරම් මුදල ණය සීමාවෙන් 75% ක ප්‍රමාණයකි. අදාල ණය වාරික, කාඩ්පත දරන්නා වෙත සමාන මාසික වාරිකවලින් හර කරනු ඇති අතර, එම මාසික වාරික කාඩ්පත මත ණය (“LOC Facility”) පහසුකමෙහි ප්‍රාග්ධන හිඟයෙහි කොටසක වෙන් කිරීමක් සහ එසේ කාඩ්පත මත ණය (“LOC Facility”) පහසුකම මගින් මුදල් අත්තිකාරම් ලබාගැනීම වෙනුවෙන් අදාල වන පරිහරණ ගාස්තු (handling fee) වෙහි ප්‍රාග්ධන හිඟයෙහි කොටසක වෙන් කිරීමක් වේ. එකී පරිහරණ ගාස්තුව (handling fee), බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.dfcc.lk හි ඇති ගාස්තු ලේඛනයෙහි විශේෂ කොට දක්වා ඇත.

7.1.3 කාඩ්පත මත ණය (“LOC Facility”) පහසුකම් මුදල, කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිනුම හර කොට, ඩීඑෆ්සීසී බැංකුවේ සරප් නියෝගයක් (the “Cashier’s Order”) ලෙස හෝ කාඩ්පත දරන්නා විසින් ඩීඑෆ්සීසී බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ/ජංගම ගිණුමකට ශ්‍රී ලංකා රුපියල්වලින් මුදල් මාරු කිරීම මගින් නිකුත් කරනු ඇත.

7.1.4 සරප් නියෝගය (the “Cashier’s Order”) නමැති විකල්පය තෝරාගෙන ඇත්නම්, එය බැංකුවේ ලියාපදිංචි කොට ඇති කාඩ්පත දරන්නාගේ තැපැල් ලිපිනය වෙත පිටත් කර යවනු ඇත. සරප් නියෝගය (the “Cashier’s Order”) විකල්පය කාඩ්පත දරන්නා වෙත ප්‍රමාදවී ලැබීම හේතුකොට ගෙන කාඩ්පත දරන්නාට සිදුවිය හැකි යම් සෘජු හෝ ආනුෂංගික පාඩු හෝ හානි වෙනුවෙන් බැංකුවේ කිසිඳු බැඳීමක් නොමැත.

7.1.5 කාඩ්පත දරන්නාගේ ගිණුමේ ණය සීමාවෙන්, කාඩ්පත මත ණය (“LOC Facility”) පහසුකමෙහි ප්‍රාග්ධන මුදලට සහ අදාල පරිහරණ ගාස්තුවලට සමාන මුදලකින් අවහිර කරනු ඇති අතර, ඒවා කාඩ්පත දරන්නා වෙත නිදහස් කරනු ලබන්නේ සහ ලබාගත හැක්කේ මාසික වාරික බිල්පතට ඇතුළත් කිරීමෙන් පසුව සහ ඊට අදාල ගෙවීම් සිදුකිරීමෙන් පසුවය.

7.1.6 කාඩ්පත මත ණය (“LOC Facility”) පහසුකමට අදාල යම් වාරිකයක් ගෙවීම කාඩ්පත දරන්නා විසින් පැහැර හරින්නේ නම්, කාඩ්පත මත ණය (“LOC Facility”) පහසුකමෙහි ඉතිරි මුළු හිඟ මුදල සමඟ

අදාලවිය හැකි යම් වෙනත් ගාස්තු අයකිරීම් පූර්වපිධානය කොට සමස්ථ හිඟ මුදල කාඩ්පත් ගිණුමට හර කිරීමට බැංකුවට අයිතියක් ඇත.

7.1.7 කාඩ්පත් ගිණුමෙහි හිඟව පවතින මුදලට අතිරේකව සිදුකරනු ලබන ගෙවීම්, කාඩ්පත මත ණය ("LOC Facility") පහසුකමෙහි බිල් නොකරන ලද වාරිකවලට එරෙහිව ස්වයංක්‍රීයව ගලපා නොගන්නා අතර, කාඩ්පත මත ණය ("LOC Facility") පහසුකම කලින් ගෙවීමට හේතු නොවේ.

7.1.8 කාඩ්පත මත ණය ("LOC Facility") පහසුකම, කාඩ්පත දරන්නා විසින් ගෙවීම සිදුකළ යුතු දිනට පෙර පියවීමට බලාපොරොත්තු වන අවස්ථාවක, කාඩ්පත් ගිණුම සඳහා ලබාදි ඇති එකී කාඩ්පත මත ණය ("LOC Facility") පහසුකම පියවන බවට ඔහුගේ/ඇයගේ අභිප්‍රාය බැංකුව වෙත ලිඛිතව දැන්විය යුතු ය. එසේ පියවීම කල් ඇතිව සිදුකරනු ලබන අවස්ථාවේදී කාඩ්පත මත ණය ("LOC Facility") පහසුකමෙහි ප්‍රාග්ධන හිඟයෙන් 4% ක ප්‍රමාණයක් කල් ඇතිව පියවීමේ ගාස්තු වශයෙන් බැංකුව විසින් අයකරගනු ඇත.

7.1.9 කාඩ්පත මත ණය ("LOC Facility") පහසුකම සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති කොන්දේසි සහ නියමයන් මෙම කාඩ්පත දරන්නාගේ ගිවිසුමෙහි අඩංගු කොන්දේසි සහ නියමයන්ට අමතරව පනවනු ලබන ඒවා මිස එමගින් එකී කොන්දේසි සහ නියමයන්ගේ අගය අඩුකිරීමක් සිදුනොවනු ඇත. කාඩ්පත මත ණය ("LOC Facility") පහසුකම, කාඩ්පත දරන්නන් වෙත ලබාදෙන විශේෂ පහසුකමක් විනා එකීකාඩ්පත මත ණය ("LOC Facility") පහසුකමට අදාල කොන්දේසි සහ නියමයන් විසින් කාඩ්පත දරන්නාගේ ගිවිසුමෙහි දැක්වෙන කොන්දේසි සහ නියමයන්ට අගතියක් හෝ බලපෑමක් සිදුනොවනු ඇත.

7.1.10 ආරවුල්ද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී කාඩ්පත මත ණය ("LOC Facility") පහසුකමට අදාල සියලුම කරුණු සම්බන්ධයෙන් බැංකුව විසින් ගනු ලබන තීරණය, අවසන් තීරණය වන අතර, කාඩ්පත මත ණය ("LOC Facility") පහසුකම ලබාදී ඇති සියලුම කාඩ්පත් දරන්නන් එකී තීරණය වෙනුවෙන් බැඳී සිටිති.

7.1.11 කාඩ්පත මත ණය ("LOC Facility") පහසුකම භාරගැනීම මගින් මෙකී කොන්දේසි සහ නියමයන්ගෙන් කාඩ්පත දරන්නා බැඳෙන බවට එකඟ වේ.

## 7.2 කාඩ්පත් වාරික ගෙවීම් සලැස්ම (Card Flexi Plan- CFP)

7.2.1 කාඩ්පත් වාරික ගෙවීම් සලැස්ම (Card Flexi Plan- CFP) මගින් කාඩ්පත දරන්නා විසින් වෙළෙඳ ස්ථානයකින් රු. 10,000/- ට වැඩි වටිනාකමකින් යුත් මිළදී ගැනීමක් ඔස්සේ සිදුකරනු ලැබූ ගණුදෙනුවක් මාස 24 ක්වූ වාරික සැලස්මකට ආවෘත කිරීමට බැංකුව විසින් කාඩ්පත දරන්නා වෙත ඉඩ ලබාදෙනු ඇති (ආයතනික ණයවර කාඩ්පත් හැර) (corporate card) අතර, බැංකුවේ තනි අභිමතය මත එම පහසුකම ඕනෑම අවස්ථාවක ඉවත් කිරීම හෝ සංශෝධනය කිරීම සිදුකළ හැකි ය.

7.2.2 මෙම වැඩසටහන සඳහා යෝග්‍ය විය හැකි උපරිම ගනුදෙනු වටිනාකම ශ්‍රී ලංකා රුපියන් 10,000/- ක් විය යුතු අතර, උපරිම ගනුදෙනු වටිනාකම (මෙහි මින්මතු යෝග්‍ය ගනුදෙනුව යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා රු. 400,000/- කි.

7.2.3 ප්‍රවර්ධන කාර්යයක් සඳහා විශේෂයෙන් දැක්වීමක් මිසක වෙනත් හැටියකින් යෝග්‍ය ගනුදෙනුවක්, කාඩ්පත් වාරික ගෙවීම් සලැස්ම (Card Flexi Plan- CFP) බවට පරිවර්තනය කළ හැක්කේ මිළදී ගැනීමට අදාල ගනුදෙනුව සිදුකළ දින සිට දින 90 ක කාලසීමාවක් තුළ පමණි.

7.2.4 යෝග්‍ය ගනුදෙනුවක්, බැංකුව විසින් තිරණය කරනු ලබන නාමමාත්‍ර පරිහරණ ගාස්තුද සමඟ මාස 3, 6, 12 හෝ 24 ක් වූ වාරික සැලසුම්වලට පරිවර්තනය කළ හැකි ය.

7.2.5 ණයවර කාඩ්පත සඳහා ලබාදී ඇති ණය සීමාව, කාඩ්පත් වාරික ගෙවීම් සලැස්මෙන් (Card Flexi Plan- CFP) ලබාගත හැකි අරමුදලෙහි සහ පරිහරණ ගාස්තුවෙහි ප්‍රමාණයට අවහිර කරනු ඇති අතර, එවා කාඩ්පත් දරන්නන් වෙත නිදහස් කරනු ලබන්නේ හෝ ලබාගත හැක්කේ මාසික වාරික බිල්පතට ඇතුලත් කිරීමෙන් පසුව සහ ඊට අදාල ගෙවීම් සිදු කිරීමෙන් පසුවය.

7.2.6 කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්මෙහි (Card Flexi Plan- CFP) මාසික වාරිකය, ආසන්නතම ඊළඟ ගිණුම් ප්‍රකාශ නියමිත දිනට කාඩ්පත දරන්නා වෙත බිල්පත් කරනු ඇත.

7.2.7 නියමිත දින වනවිට අවම මුදල ගෙවීම කාඩ්පත දරන්නා විසින් පැහැර හැරියහොත්,කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්මෙහි (Card Flexi Plan- CFP) හිඟ මුදල් පූර්වාපිධානය (foreclose) කොට එය සමස්ථ හිඟ මුදලට හර කිරීමේ අයිතිය බැංකුව සතු වේ.

7.2.8 ණයවර කාඩ්පතෙහි හිඟ මුදලට අතිරේකව සිදුකරනු ලබන ගෙවීම්, බිල්පත් නොකරන ලද වාරිකවලට එදිරිව ස්වංක්‍රීයව ගැලපීම සිදුනොකරනු ඇති අතර, කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්මෙහි (Card Flexi Plan- CFP) කලින් ගෙවීම් එහි ප්‍රතිඵලයක් නොවනු ඇත.

7.2.9 යම් හෙයකින් කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්ම (Card Flexi Plan- CFP)කාඩ්පත දරන්නා විසින් ගෙවීම සිදුකළ යුතු දිනට පෙර පියවීමට අදහස් කරන්නේ නම්, ණයවර කාඩ්පත ගිණුමට ලබාදී ඇති කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්ම (Card Flexi Plan- CFP) පියවා දමන ලෙසට සිය අභිප්‍රාය සඳහන් කරමින් ඔහු/ඇය විසින් ලිඛිතව දැනුම්දිය යුතු ය. එසේ කලින් පියවනු ලබන අවස්ථාවකදී කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්මෙහි (Card Flexi Plan- CFP) ප්‍රාග්ධන හිඟ මුදලෙන්4% ක කලින් පියවීමේ ගාස්තුවක්අයකරනු ඇත.

7.2.10 සියලුම හිඟ වාරික මුදල් ණයවර කාඩ්පත් ගිණුම් ප්‍රකාශයට බිල්පත් කිරීමට පෙර කාඩ්පත දරන්නා සිය ණයවර කාඩ්පත වසා දමන්නේ නම්, කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්මෙහි (Card Flexi Plan- CFP) හිඟ වාරික මුදල් එක් ඒකාබද්ධ මුදලක් ලෙස ණයවර කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

7.2.11 කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්ම (Card Flexi Plan- CFP) පහසුකම ලබාගැනීම හේතුවෙන් ගනු ලබන යම් ක්‍රියාමාර්ගයක්, හිමිකම්, ඉල්ලීම්, සිදුවන පාඩු, හානි, ගාස්තු අයකිරීම් සහ වියදම් කාඩ්පත දරන්නාට විඳීමට, දැරීමට හෝ ඉසිලීමට සිදුවීම සම්බන්ධ වගකීමෙන් කාඩ්පත දරන්නා විසින් බැංකුව නිදහස් කළ යුතු ය.

7.2.12 කාඩ්පත් සුනම්‍ය සැලැස්ම (Card Flexi Plan- CFP) පහසුකම සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති කොන්දේසි සහ නියමයන් මෙම කාඩ්පත දරන්නාගේ ගිවිසුමෙහි අඩංගු කොන්දේසි සහ නියමයන්ට අමතරව පනවනු ලබන ඒවා මිස එමගින් එකී කොන්දේසි සහ නියමයන්ගේ අගය අඩුකිරීමක් සිදුනොවනු ඇත. කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්ම (Card Flexi Plan- CFP) පහසුකම, කාඩ්පත දරන්නන් වෙත ලබාදෙන විශේෂ පහසුකමක් විනා එකී කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්ම (Card Flexi Plan- CFP) පහසුකමට අදාල කොන්දේසි සහ නියමයන් විසින් කාඩ්පත දරන්නාගේ ගිවිසුමෙහි දැක්වෙන කොන්දේසි සහ නියමයන්ට අගතියක් හෝ බලපෑමක් සිදුනොවනු ඇත.

7.2.13 ආරවුල්ද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්ම (Card Flexi Plan- CFP) පහසුකමට අදාල සියලුම කරුණු සම්බන්ධයෙන් බැංකුව විසින් ගනු ලබන තීරණය, අවසන් තීරණය වන අතර, කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්ම (Card Flexi Plan- CFP) පහසුකම ලබාදී ඇති සියලුම කාඩ්පත් දරන්නන් එකී තීරණය වෙනුවෙන් බැඳී සිටිති.

7.2.14 කාඩ්පත් වාරික ගෙවීම් සැලැස්ම (Card Flexi Plan- CFP) පහසුකම භාරගැනීම මගින් කාඩ්පත් ගිණුමෙහි දැක්වෙන මෙකී කොන්දේසි සහ නියමයන්ගෙන් සහ බැංකුවේ තීරණය සමඟ බැඳෙන බවට කාඩ්පත දරන්නා එකඟ වේ.

7.3 කාඩ්පත් ශේෂය මාරු කිරීම (Card Balance transfer - CBT)

7.3.1 කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකම මගින් කාඩ්පත් දරන්නා වෙත වෙනත් බැංකුවකින් නිකුත් කරන ලද ණයවර කාඩ්පතක තිබෙන ණය ශේෂය ඔහු/ඇය විසින් ඩීඑෆ්සීසී බැංකුවේ පවත්වාගෙන යනු ලබන ණයවර කාඩපත් ගිණුමට මාරු කිරීම අවස්ථාව ලබා දෙයි.

7.3.2 මෙම පහසුකම භාවිතා කරමින් මාරු කළ හැකි අවම මුදල ශ්‍රී ලංකා රු.20,000/- ක් වන අතර, උපරිම මුදල කාඩ්පත දරන්නා වෙත ලබාදී ඇති ණය සීමාවෙන් 75% ක ප්‍රමාණයක් දක්වා වේ.

7.3.3 මාරු කළ හැකි ශේධය, බැංකුව විසින් තිරණය කරනු ලබන නාමමාත්‍ර පරිහරණ ගාස්තුද සමඟ මාස 12 හෝ 24 ක් වූ වාරික සැලසුම්වලට පරිවර්තනය කළ හැකි ය.

7.3.4 ණයවර කාඩ්පත සඳහා ලබාදී ඇති ණය සීමාව, කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකමෙන් ලබාගත හැකි මූලික මුදලෙහි සහ පරිහරණ ගාස්තුවෙහි ප්‍රමාණයට අවහිර කරනු ඇති අතර, එවා කාඩ්පත් දරන්නන් වෙත නිදහස් කරනු ලබන්නේ හෝ ලබාගත හැක්කේ මාසික වාරික බිල්පතට ඇතුලත් කිරීමෙන් පසුව සහ ඊට අදාල ගෙවීම් සිදු කිරීමෙන් පසුවය.

7.3.5 කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකමෙහි මාසික වාරිකය, ආසන්නතම ඊළඟ ගිණුම් ප්‍රකාශ නියමිත දිනට කාඩ්පත දරන්නා වෙත බිල්පත් කරනු ඇත.

7.3.6 අවම ගෙවීම සිදුකළ යුතු දිනට එය ගෙවීමට කාඩ්පත දරන්නා විසින් පැහැර හරින්නේ නම්, කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකමෙහි හිඟ මුදල පූර්වපිධානය කොට සමස්ථ හිඟ මුදල මාසික බිල්පතට හර කිරීමේ අයිතිය බැංකුව සතු වේ. කාඩ්පත් ගිණුමෙහි හිඟව පවතින මුදලට අතිරේකව සිදුකරනු ලබන ගෙවීම්, කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකමෙහි බිල් නොකරන ලද වාරිකවලට එරෙහිව ස්වයංක්‍රීයව ගලපා නොගන්නා අතර, කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකම කලින් පියවීමක් ලෙස සලකනු ලබන්නේ නැත.

7.3.7 යම් හෙයකින් කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකම කාඩ්පත දරන්නා විසින් ගෙවිම සිදුකළ යුතු දිනට පෙර පියවීමට අදහස් කරන්නේ නම්, ණයවර කාඩ්පත ගිණුමට ලබාදී ඇති කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකම වසා දමන ලෙසට සිය අභිප්‍රාය සඳහන් කරමින් ඔහු/ඇය විසින් ලිඛිතව දැනුම්දිය යුතු ය. එසේ කලින් පියවනු ලබන අවස්ථාවකදී කා කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකමෙහි ප්‍රාග්ධන හිඟ මුදලෙන්4% ක කලින් පියවීමේ ගාස්තුවක් අයකරනු ඇත.

7.3.8 සියලුම හිඟ වාරික මුදල් ණයවර කාඩ්පත් ගිණුම් ප්‍රකාශයට බිල්පත් කිරීමට පෙර කාඩ්පත දරන්නා සිය ණයවර කාඩ්පත වසා දමන්නේ නම්, කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකමෙහි හිඟ වාරික මුදල් එක් ඒකාබද්ධ මුදලක් ලෙස ණයවර කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

7.3.9 කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකම ලබාගැනීම හේතුවෙන් ගනු ලබන යම් ක්‍රියාමාර්ගයක්, හිමිකම්, ඉල්ලීම්, සිදුවන පාඩු, හානි, ගාස්තු අයකිරීම් සහ වියදම් කාඩ්පත දරන්නාට විඳීමට, දැරීමට හෝ ඉසිලීමට සිදුවීම සම්බන්ධ වගකීමෙන් කාඩ්පත දරන්නා විසින් බැංකුව නිදහස් කළ යුතු ය.

7.3.10 කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකම සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති කොන්දේසි සහ නියමයන් මෙම කාඩ්පත දරන්නාගේ ගිවිසුමෙහි අඩංගු කොන්දේසි සහ නියමයන්ට අමතරව පනවනු ලබන ඒවා මිස එමගින් එකී කොන්දේසි සහ නියමයන්ගේ අගය අඩුකිරීමක් සිදුනොවනු ඇත. කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකම, කාඩ්පත දරන්නන් වෙත ලබාදෙන විශේෂ පහසුකමක් විනා එකී කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකමට අදාල කොන්දේසි සහ නියමයන් විසින් කාඩ්පත දරන්නාගේ ගිවිසුමෙහි දැක්වෙන කොන්දේසි සහ නියමයන්ට අගතියක් හෝ බලපෑමක් සිදුනොවනු ඇත.

7.3.11 ආරවුල්ද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකමට අදාල සියලුම කරුණු සම්බන්ධයෙන් බැංකුව විසින් ගනු ලබන තීරණය, අවසන් තීරණය වන අතර, කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකම ලබාදී ඇති සියලුම කාඩ්පත් දරන්නන් එකී තීරණය වෙනුවෙන් බැඳී සිටිති.

7.3.12 කාඩ්පත් ශේෂය මාරු කිරීමේ (Card Balance transfer - CBT) පහසුකම භාරගැනීම මගින් කාඩ්පත් ගිණුමෙහි දැක්වෙන මෙකී කොන්දේසි සහ නියමයන්ගෙන් සහ බැංකුවේ තීරණය සමඟ බැඳෙන බවට කාඩ්පත දරන්නා එකඟ වේ.

**8.** ගාස්තු සහ අයකිරීම්

(කාඩ්පත් වර්ගය අනුව සමහර අයකිරීම් කලින් කලට නිදහස් කරනු ඇත - කරුණාකර අදාල නිෂ්පාදන විස්තර බලන්න. සම්පූර්ණ විස්තර සඳහා www.dfcc.lk දරණඅපගේ වෙබ් අඩවියට පිවිස එහි පලකොට ඇති ගාස්තු ලේඛන මාර්ග විස්තරය බලන්න)

**8.1** කාඩ්පත සඳහා වන සම්බන්ධවීමේ ගාස්තුව සහ වාර්ෂික ගාස්තුව ගෙවීමට කාඩ්පත දරන්නා එකඟ වේ. එකී ගාස්තු ගෙවිය යුතු දින වනවිට කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

**8.2** කාඩ්පත ජවදූත සේවයක් (courier) මගින් පිටරට ලිපිනයකට යවනු ලබන අවස්ථාවක බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි ඒ සඳහා වන පරිහරණ ගාස්තුව කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

**8.3** කාඩ්පත් ගිණුමෙහි පිටපත් සඳහා වන පරිහරණ ගාස්තු බංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

**8.4** මුළු හිඟ මුදල, ගෙවීම සිදුකළ යුතු දිනට කාඩ්පත දරන්නා විසින් පියවනු නොලැබුවහොත්, www.dfcc.lk දරණ බැංකුවේ වෙබ් අඩවියෙහි පලකොට ඇති ගාස්තු ලේඛනයෙහි දක්වා ඇති පරිදි හෝ බැංකුව විසින් ලිඛිතව දන්වනු ලබන පරිදි වර්තමාන ගිණුම් ප්‍රකාශ දිනයෙන් පටන්ගෙන ඊළඟ ගිණුම් ප්‍රකාශ දිනය දක්වා ගිණුම් ප්‍රකාශයේ දැක්වෙන ශේෂය දෛනිකව ගණනය කොට කලින් කලට බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් මත පොලී මුදලක් අයකරගනු ඇත. ඉහත දැක්වූ කාලපරිඡේදය තුළ ලැබුනු බිල්පත්, පොලී මුදල් ගණනය කිරීම කාර්යය සඳහා සැලකිල්ලට නොගනු ඇත. කෙසේ වෙතත්, සිදුකරන ලද ගෙවීම් මෙකී කාර්යය සඳහා සැලකිල්ලට ගනු ඇත.

**8.5** ඉහත 8.4 වගන්තියේ දක්වා ඇති පොලී මුදල් ගෙවීමට අගති රහිතව, අවම ගෙවීම සිදුකළ යුතු දිනට ගෙවීමට කාඩ්පත දරන්නා අපොහොසත් වුවහොත්, www.dfcc.lk දරණ බැංකුවේ වෙබ් අඩවියෙහි පලකොට ඇති ගාස්තු ලේඛනයෙහි දක්වා ඇති පරිදි කලින් කලට විශේෂ කොට දක්වනු ලබන අනුපාතකට හෝ අනුපාතවලට යටත්ව බැංකුව විසින් ගාස්තුවක් අයකොට කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

**8.6** බැංකුවේ තීරණය පරිදි සිදුකරනු ලබන වෙනස්වීම්වලට යටත්ව සහ කාඩ්පත දරන්නා වෙත බැංකුව ලිඛිතව දැනුම් දෙනු ලබන පරිදි ණයවර කාඩ්පත භාවිතා කරමින් ගනු ලබන සියලුම මුදල් අත්තිකාරම් සඳහා එකී අත්තිකාරම් මුදලින් 3% ක අනුපාතයකට යටත්ව පරිහරණ ගාස්තුවක් අයකොට කාඩ්පත් ගිණුමට හර කරනු ඇත. බිලපත් කාලපරිඡේදය තුළ නියම කර ඇති ණය සීමාව ඉක්මවා ගොස් ඇත්නම් ඒ සඳහා බැංකුව විසින් තිරණය කරනු ලබන පරිදි අධිසීමා ගාස්තුවක් අයකොට කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

**8.7** ණය සීමාව ඉක්මවා ගොස් ඇති බව ගනනය කිරීමේදී, බැංකු ගාස්තු වශයෙන් ගිණුමට හර කර ඇති ඕනෑම මුදලක් මෙකී කාර්යය පිණිස සැලකිල්ලට ගනු ඇත.0

**8.8** ණයවර කාඩ්පත භාවිතා කරමින් ශ්‍රී ලංකාව තුළ පිහිටා තිබෙන ඉන්ධනහල්වලදී සිදුකරනු මිළදී ගැනීම් එනම්, පෙට්‍රල්, ඩීසල්, ගෑස් සහ අනිකුත් සැපයුම් වෙනුවෙන් එකී වෙළඳ භාණ්ඩයේ වෙළඳ වටිනාකමින් 2.0% ක අනුපාතයකට යටත්ව පරිහරණ ගාස්තුවක් අයකොට කාඩ්පත් ගිණුම හර කරනු ඇති අතර, එකී අනුපාතය බැංකුවේ තීරණය පරිදි වෙනස්විය හැකි ය.

**8.9** කාඩ්පත භාවිතා කරමින් විදේශ රටකදී (ශ්‍රී ලංකාවෙන් පිටත, ප්‍රභවස්ථාන රට) සිදුකරනු ලබන එක් එක් සහ සෑම ගනුදෙනුවක් සඳහාම වන සියලුම ව්‍යවස්ථාපිත අයකිරීම් කාඩ්පතට හර කරනු ඇත. මෙකී ව්‍යවස්ථාපිත අයකිරීම් කාඩ්පත දරන්නා වෙත පූර්ව දැනුම්දීමක් රහිතව කලින් කලට සංශෝධනය කරනු ඇත).

**8.10** කාඩ්පත දරන්නා විසින් කාඩ්පත් ගිණුමෙහි තැන්පත් කරනු ලබන මුදල්වලින්, ව්‍යවස්ථාපිත අයකිරීම්, ගෙවීම්, ගාස්තු සහ අයකිරීම් සහ බැංකුවට ගෙවිය යුතු ගාස්තු සහ කාඩ්පත දරන්නා විසින් ගනු ලැබූ මුදල් අත්තිකාරම් එක් එක් නොපියවන ලද කාඩ්පත් ගිණුම් ප්‍රකාශය වෙනුවෙන් පළමුකොට ගෙන අඩුකරගනු ලබන අතර, කාඩ්පත භාවිතා කරමින් සිදුකරනු ලැබූ ගනුදෙනුව සැලකිල්ලට ගනිමින් කාඩ්පත් ගිණුමෙහි පෙන්වා ඇති හිඟ ශේෂයන් අඩුකිරීමේදී ශේෂ මුදල පමණක් අදාල කරගනු ඇත.

**9.** පරිපූරක කාඩ්පත්

කාඩ්පත දරන්නාගේ ඉල්ලීම මත ඔහු/ඇය විසින් නම් කරනු ලබන පාර්ශවයක් සඳහා ප්‍රාථමික කාඩ්පත දරන්නාගේ සමීප පවුලේ සාමාජිකයෙකු වෙත පරිපූරක කාඩ්පතක්/කාඩ්පත් බැංකුවේ අභිමතය පරිදි නිකුත් කරනු ඇත. කාඩ්පත දරන්නාගේ සහ පරිපූරක කාඩ්පත/කාඩ්පත් දරන්නාගේ/දරන්නන්ගේ කාඩ්පත් ගිණුම් ඒකාබද්ධ කර තිබුණද ඒවා වෙන වෙනම තිබුණද කාඩ්පත සහ පරිපූරක කාඩ්පත/කාඩ්පත් භාවිත කිරීම සම්බන්ධයෙන් කාඩ්පත දරන්නා සහ පරිපූරක කාඩ්පත/කාඩ්පත් දරන්නා/දරන්නන් යන සියලුම දෙනා එක්ව සහ වෙන් වෙන්ව වගකියනු ඇත. ඕනෑම පරිපූරක කාඩ්පත/කාඩ්පත් දරන්නෙකු/දරන්නන් මෙම ගිවිසුමෙහි දැක්වෙන කොන්දේසි සහ නියමයන්ගෙන් බැඳෙනු ඇත. මූලික කාඩ්පත දරන්නාගේ අභිමතය පරිදි ඔහු/ඇය වෙත ලබාදී ඇති ණය සීමාවම හෝ ඊට පහළ ණය සීමාවක් පරිපූරක කාඩ්පත දරන්නා වෙත ලබාදිය හැකි ය.

**9.1** ප්‍රාථමික කාඩ්පත දරන්නා හෝ පරිපූරක කාඩ්පත දරන්නා යන දෙදෙනාම යවනු හෝ දෙනු ලබන ලබන සියලුම සන්නිවේදන ඒ දෙදෙනාම වෙත යවනු හෝ දෙනු ලැබුවා යැයි සලකනු ඇත.

**9.2** කාඩ්පත් ගිණුම පරිහරණය කිරීම සම්බන්ධයෙන් ප්‍රාථමික කාඩ්පත දරන්නා සහ පරිපූරක කාඩ්පත දරන්නා යන දෙදෙනාගෙන් ඕනෑම අයෙක් හෝ ප්‍රාථමික කාඩ්පත දරන්නා විසින් ලිඛිතව බලය ලබාදී ඕනෑම තුන්වන පාර්ශවයක් විසින් නිකුත් කරනු ලබන සියලුම උපදෙස් සහ ඔවුන්ගෙන් ඕනෑම අයෙකු විසින් සිදුකරනු ලබන ඉල්ලීම් හෝ උද්දේශික ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රාථමික කාඩ්පත දරන්නා සහ පරිපූරක කාඩ්පත දරන්නා යන දෙදෙනාම බැඳිය යුතු අතර, එවැනි අවස්ථාවකදී ප්‍රාථමික කාඩ්පත දරන්නා විසින් බලය ලබාදී ඇති එවැනි තුන්වන පාර්ශවයක් විසින් නිකුත් කරනු ලබන උපදෙස්වලට අනුව බැංකුව කටයුතු කිරීම හේතුකොට ගෙන බැංකුවට දැරීම සිදුවන ඕනෑම ස්වභාවයක යම් පාඩුවක්, හානියක්, හිමිකමක්, පිරිවැයක් හෝ වියදමක් යනාදියෙන් බැංකුව, ප්‍රාථමික කාඩ්පත දරන්නා විසින් නිදහස් කරනු ඇත.

**9.3** ඒකාබද්ධ ණය සීමාව ප්‍රාථමික කාඩ්පත දරන්නා සහ සියලුම පරිපූරක කාඩ්පත් දරන්නන් යන අය සඳහා සාමූහිකව අදාල වන අතර, අනුපිළිවෙලට ඔවුන් විසින් දරනු ලබන වර්තමාන ශේෂය, ඒකාබද්ධ ණය සීමාව ඉක්මවා යන ආකාරයේ කාඩ්පත් ගනුදෙනුවක් ප්‍රාථමික කාඩ්පත දරන්නා සහ සියලුම පරිපූරක කාඩ්පත් දරන්නන් විසින් සිදු නොකළ යුතු ය.

**9.4** මෙහි පහත 21 වෙනි වගන්තියේ දැක්වෙන කරුණුවලට අගති රහිතව සහ අපගේ පරම අභිමතය මත බැංකුට මැනවැයි හැඟෙන පරිදි මෙම ගිවිසුම යටතේ බැංකුවේ අයිතීන් බලාත්මක කරමින් හෝ ඊට ප්‍රාරම්භකව කාඩ්පත දරන්නාගේ හෝ කාඩ්පත් ගිණුමේ විස්තර තොරතුරු පරිපූරක කාඩ්පත දරන්නා වෙත සහ ප්‍රාථමික කාඩ්පත දරන්නා විසින් බලය ලබාදී ඇති පුද්ගලයින්ද ඇතුළුව එවැනි වෙනත් පුද්ගලයින් වෙත අනාවරණය කිරීමට ප්‍රාථමික කාඩ්පත දරන්නා විසින් බැංකුවට මෙයින් බලය ලබා දේ.

**9.5** මෙහි පහත 11.1 වගන්තියට අනුව ඕනෑම පරිපූරක කාඩ්පතක් භාවිතා කිරීම ඕනෑම අවස්ථාවක අවසන් කිරීමේ හිමිකම ප්‍රාථමික කාඩ්පත දරන්නා ඇති අතර, පරිපූරක කාඩ්පත දරන්නා විසින් ඔහුගේ/ඇයගේ පරිපූරක කාඩ්පත භාවිතා කිරීම අවසන් කළ හැකි ය. එසේ කළ හැකි වන්නේ එවැනි පරිපූරක කාඩ්පතක් භාවිතය අවසන් කිරීමේ කාර්යය පිණිස පරිපූරක කාඩ්පතක් බැංකුව වෙත ලැබුණොත් මිසක සහ ලැබෙන තෙක් වන අතර, ප්‍රාථමික කාඩ්පත දරන්නා හෝ යම් පරිපූරක කාඩ්පතක් දරන්නෙකු විසින් ඒ වෙනුවෙන් නිකුත් කරනු ලබන උපදෙස්වලින් බැංකුව නොබැඳෙනවා පමණක් නොව ඒවාට යටත් වන්නේද නැත. එතෙකුදු වුවත්, මෙම ගිවිසුම යටතේ ප්‍රාථමික කාඩ්පත දරන්නාගේ සහ පරිපූරක කාඩ්පත දරන්නාගේ අනුපිළිවෙළ බැඳීම් සහ වගකීම් එවැනි පරිපූරක කාඩ්පතක් භාවිතා කිරීම අවසන් කරනු ලබන තෙක් අඛණ්ඩව පවතිනු ඇත.

**9.6** මෙම ගිවිසුම යටතේ ප්‍රාථමික කාඩ්පත දරන්නා සහ පරිපූරක කාඩ්පත දරන්නා නිසා බැංකුවට තිබෙන සියලුම පොරොන්දු, වගකීම් සහ බැඳීම්, ප්‍රාථමික කාඩ්පත දරන්නාට සහ පරිපූරක කාඩ්පත දරන්නාට එරෙහිව කිසිඳු ආරවුලක හෝ පිළියැදුමක හෝ හිළව් කිරීමේ අයිතිවාසිකමක ආකාරයෙන් අගතියක් හෝ බලපෑමක් ඇති නොකරනු ඇත.

**9.7** කිසිඳු හේතුවක් නිසා හෝ පරිපූරක කාඩ්පත දරන්නාගේ යම් වගකීම් නිදහස් කිරීම හෝ අත්හැරීම, ප්‍රාථමික කාඩ්පත දරන්නාගේ පොරොන්දුවලට, වගකීම්වලට හෝ ප්‍රාථමික කාඩ්පත දරන්නාට එරෙහිව සහ ප්‍රතිලෝම වශයෙන් අපගේ අයිතිවාසිකම් හෝ පිළියම්වලට අගතියක් ඇති නොකරනු ඇත.

**10.** ඩීඑෆ්සීසී බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර **(ATM)** භාවිතා කිරීම

**10.1** ණයවර කාඩ්පතට සම්බන්ධ කර ඇති කාඩ්පත දරන්නාගේ කාඩ්පත් ගිණුම සහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන අනිකුත් ගිණුම් මත ඩීඑෆ්සීසී බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර **(ATM)** සහ අනිකුත් ස්වයංක්‍රීටෙලර් යන්ත්‍ර **(ATM)** ඔස්සේ ගනුදෙනු කිරීම ඉඩ ලබාදී ඇති පරිදි කාඩ්පත දරන්නන්ට විසින් සිය කාඩ්පත් භාවිතා කළ හැකි ය.

**10.2** ඩීඑෆ්සීසී බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය **(ATM)** සහ අනිකුත් ස්වයංක්‍රීය ටෙලර්යන්ත්‍ර ඔස්සේ කාඩ්පත දරන්නාගේ ජංගම/ඉතිරි කිරීමේ ගිණුමන් පහසුකම් ලබාගැනීම පිණස කාඩ්පත භාවිතා කිරීම, ඩීඑෆ්සීසී බැංකු කාඩ්පත සඳහා නියමකොට ඇති පරිදි සියලුම සේවාවන්/පහසුකම් සහ අනිකුත් ගනුදෙනු හසුරුවනු ලබන තත්කාලීන කොන්දේසි සහ නියමයන්ට යටත්විය යුතු ය.

**10.3** කාඩ්පත දරන්නාගේ දැනුවත්භාවය හෝ අවසරය සහිතව හෝ රහිතව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර**(ATM)** හරහා සිදුකරනු ලබන සියලුම ගනුදෙනු සඳහා කාඩ්පත දරන්නන් වගකිව යුතු ය. කාඩ්පත දරන්නාගේ කාඩ්පත් ගිණුමෙන් හෝ ඔහුගේ/ඇයගේ වෙනත් සම්බන්දිත ගිණුමකින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර **(ATM)** හරහා මුදල් ලබාගත් අවස්ථාවක බැංකුව විසින් අවශ්‍ය පරිදි එය කාඩ්පත දරන්නාගේ හෝ අනිකුත් අනුපිළිවෙල ගිණුමට හර කරනු ඇත. ප්‍රාථමික කාඩ්පත දරන්නාගේ ඉල්ලීම පිට පරිපූරක කාඩ්පත් නිකුත් කරනු ලබන අවස්ථාවක, කාඩ්පත භාවිතා කරමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය **(ATM)** හරහා මුදල් ලබාගැනීම **අදාල** යම් බැංකු ගාස්තු වෙනුවෙන් කාඩ්පත දරන්නා සහ පරිපූරක කාඩ්පත දරන්නා එක්ව සහ වෙන් වෙන්ව වගකිව යුතු ය.

**10.4** කාඩ්පත දරන්නාගේ ජංගම/ඉතිරි කිරීමේ ගිණුම්වලට අදාල ගනුදෙනුවල බැංකුව සතු සියලුම වාර්තා තීරණාත්මක වන බවටත්, සඳහා කාඩ්පත දරන්නා සියලුම කාර්යයන් බැඳෙන බවට ඔහු/ඇය එකඟ වේ.

**10.5** කාඩ්පත දරන්නා විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර **(ATM)** හරහා සිදුකරනු ලබන ගනුදෙනු හේතුකොට ගෙන හටගත හැකි යම් ආරවුල්සහගත තත්ත්වයක් සම්බන්ධයෙන් බැංකුව විසින් විමර්ශනය කරනු ඇති අතර, බැංකුවේ සෑහීමට පත් වීමට කරුනු ඔප්පු නොවුවහොත් එය කාඩ්පත දරන්නාගේ/දරන්නන්ගේ වගකීම් වලට එකතු කරනු ඇත. පුද්ගලික අනන්‍යතා අංකය (PIN) භාවිතා කළ යුතු බැවින් කාඩ්පතක් නැතිවීම සම්බන්ධ වාර්තා කිරීමක් හේතුකොට ගෙන මෙම වගකීම් වලට එකතු කිරීම අත්හිටුවීම හෝ අවලංගු නොකරනු ඇත. පුද්ගලික අනන්‍යතා අංකය (PIN) අංකය ආරක්ෂා සහිතව සහ සුරක්ෂිතව වෙනම තබා ගන්නා ලෙස කාඩ්පත දරන්නන්ට විශේෂකොට ගෙන උපදෙස්දී ඇති අතර, එසේ කිරීමට අපොහොසත්වීම යනු මෙම බැඳීම පිළිගත් බවට සලකනු ඇත.

**11.** අවසන් කිරීම

**11.1** කාඩ්පත හෝ වෙනත් පරිපූරක කාඩ්පත/කාඩ්පත් සමඟ බැංකුව වෙන කරනු ලබන ලිඛිත දැනුම්දීමක් මගින් මෙම ගිවිසුම කාඩ්පත දරන්නා හෝ පරිපූරක කාඩ්පත දරන්නා විසින් අවසන් කළ හැකි ය. මෙම ගිවිසුම, පරිපූරක කාඩ්පත/කාඩ්පත් භාවිතා කිරීමට අදාල වන අවස්ථාවක**[**එය පරිපූරක කාඩ්පත/කාඩ්පත භාවිතා

කිරීමට අදාල වන තාක් කල්], එකී පරිපූරක කාඩ්පත/කාඩ්පත් සමඟ බැංකුව වෙත කරනු ලබන ලිඛිත දැනුම්දීමක් මගින් මෙම ගිවිසුම පරිපූරක කාඩ්පත/කාඩ්පත් දරන්නා/දරන්නන් විසින් අවසන් කළ හැකිය. එසේ දන්වනු ලබන ලිඛිත දනුම් දීමත් සමග, කාඩ්පත් හිමියා / පරිපූරක කාඩ්පත් හිමියා බැන්කුව විසින් පිරිනමා ඇති කාඩ් පත කබලි දෙකකට කපා වෙන් කර බැන්කුව වෙත භාර දිය යුතුය.

**11.2** පූර්ව දැනුම්දීමක් සහිතව හෝ රහිතව සහ හේතුවක් සහිතව හෝ රහිතව මෙම කාඩ්පත අවලංගු කිරීමෙන් හෝ අළුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් ඕනෑම අවස්ථාවක මෙම ගිවිසුම බැංකුව විසින් අවසන් කළ හැකි ය. එසේ අවසන් කිරීමක් සිදුවීමකින් මිසක සහ සිදුවන තෙක් බැංකුව විසින් කලින් කලට කාඩ්පත දරන්නා වෙත අළුත් කාඩ්පතක් (අලුත් කළ කාඩ්පත) ලබාදෙනු ඇත.

11.3 කාඩ්පත් ගිණුමේ තිබෙන සම්පූර්ණ හිඟ ශේෂය සමඟ කාඩ්පත් ගනුදෙනුවක් හේතුකොට ගෙන තිබෙන යම් හිඟ මුදලක් එහෙත් එය තවමත් කාඩ්පත් ගිණුමට අයකර නොමැති නම්, වහාම ඒවා බැංකුව වෙත ගෙවිය යුතු හිඟ මුදල් බවට පත්වන අතර, මෙම ගිවිසුම අවසන් කරනු ලබන අවස්ථාවේදී හෝ කාඩ්පත දරන්නා වස්තුභංගත්වයට පත්වූවහොත් හෝ ඔහු/ඇය මරණයට පත්වූවහොත් බැංකුවට සම්පූර්ණයෙන් ගෙවිය යුතු ය. කාඩ්පත් ගිණුම වෙනුවෙන් තිබෙන ඕනෑම හිඟ මුදලක් වෙනුවෙන් කාඩ්පත දරන්නා හෝ ඔහුගේ/ඇයගේ පදවි නාමය වගකිව යුතු අතර, එවැනි හිඟ මුදල් අයකර ගැනීමේදී බැංකුවට දැරීමට සිදුවන සියලුම පිරිවැය, ගාස්තු අයකිරීම් (නෛතික ගාස්තුද ඇතුළුව) සහ වියදම්වලින් බැංකුව නිදහස් කොට තැබිය යුතු ය. එවැනි ගෙවීම් හිඟව තැබුවහොත් ඉහත 8 වෙනි ඡේදය ප්‍රකාරව එහි දක්වා ඇති අනුපාතය/අනුපාතවලට යටත්ව මූල්‍ය ගාස්තු සහ අනිකුත් ගාස්තු අඛණ්ඩව අයකිරීමට බැංකුවට හිමිකම ඇත.

11.4 මෙම ගිවිසුම උල්ලංඝනය කිරීම හේතුකොට ගෙන යම් පාඩුවක් හෝ වියදමක් බැංකුවට දැරීමට සිදුවූවා යැයි බැංකුව තීරණය කළහොත් කාඩ්පත දරන්නා/දරන්නන් සහ/හෝ පරිපූරක කාඩ්පත දරන්නා/දරන්නන් ඒ වෙනුවෙන් වගකිව යුතු ය.

11.5 එතෙකුදු වුවත් මෙම ගිවිසුම යම් පාර්ශවයක් විසින් අවසන් කලද, කාඩ්පත භාවිතා කිරීම හේතුකොට ගෙන දැරීමට සිදුවන තවදුරටත් ගාස්තු ගෙවීම් වෙන්වෙන් කාඩ්පත දරන්නා අඛණ්ඩව වගකිව යුතු ය.

12. කාඩ්පත පුද්ගලික අනන්‍යතා අංකය (PIN) නැතිවීම

පුද්ගලික අනන්‍යතා අංකයේ(PIN) සහ කාඩ්පතෙහි සුරක්ෂිතභාවය සහ පුද්ගලික අනන්‍යතා අංකය (PIN) වෙනත් පුද්ගලයෙකු විසින් දැනගැනීම වැළැක්වීම වෙනුවෙන් ගත හැකි සියලුම පියවරයන් කාඩ්පත දරන්නා විසින් ගත යුතු ය.

12.1 කාඩ්පතක සහ/හෝ පුද්ගලික අනන්‍යතා අංකය (PIN) නැතිවූවිට හෝ සොරකම් කරනු ලැබූවහොත් එය නැතිවී ඇති බවට හෝ සොකරම් කර ඇති බවට දැනගත් වහාම ඒ බැව් දුරකථනයෙන්, විද්‍යුත් තැපෑලෙන්, ෆැක්ස් මගින් හෝ ටෙලෙක්ස් පණිවුඩයක් මගින් බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙතද ලිඛිතව පොලිස් ස්ථානය වෙතද වාර්තා කල යුතු අතර, එවැනි අවස්ථාවකදී දුරකථනයෙන්, විද්‍යුත් තැපෑලෙන්, ෆැක්ස් මගින් හෝ ටෙලෙක්ස් පණිවුඩයක් මගින් බැංකුව වෙත සිදුකරනු ලබන දැනුම්දීම ලිඛිතව කරනු ලැබූ දැනුම්දීමක් බවට බැංකුව තුලින් තහවුරු කර ගත යුතුය. කාඩ්පත සහ/හෝ පුද්ගලික අනන්‍යතා අංකය (PIN) නැතිවූ බවට බැංකුව හෝ එය සොරකම් කර ඇති බවට නිසි පරිදි බැංකුව වෙත දැනුම්දෙනු ලබන අවස්ථාව දක්වා සහ පසුව බැංකුව ඒ බැව් ලිඛිතව වෙත දැනුම් දෙනු ලබන අවස්ථාව දක්වා කාඩ්පත අනවසර භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කාඩ්පතට හර කරනු ලබන සියලුම මුදල් ගණන් සහ සිදුකරන ලද ගනුදෙනු වෙනුවෙන් ඒ වනවිටත් ගිණුමට හර කර නොමැති මුදල් ගණන් ඇතුළු සියල්ල වෙනුවෙන් කාඩ්පත දරන්නා වගකිව යුතු ය. කාඩ්පත දරන්නා විසින් නැතිවූ හෝ සොරකම් කරන ලද කාඩ්පත/කාඩ්පත් සොයාගනු ලැබූ අවස්ථාවක එසේ සොයාගනු ලැබූ කාඩ්පත/කාඩ්පත් වහාම බැංකුව වෙත ආපසු ලබාදිය යුතු ය.

12.2 කාඩ්පතක් නැතිවීමක්, සොරකම් කිරීමක් හෝ අවභාවිතා කිරීමක් සිදුවූ හෝ පුද්ගලික අනන්‍යතා අංකය (PIN)අනාවරණයවී ඇති අවස්ථාවක, එසේ නැතිවූ කාඩ්පත සොයා ගැනීමට උපකාරී වියහැකි යැයි බැංකුව විසින් සලකනු ලබන, කාඩ්පත දරන්නා විසින් තම සන්තකයේ පවතින සියලුම තොරතුරු විසින් බැංකුව වෙත ලබාදිය යුතු ය.

12.3 කාඩ්පතක් නැතිවීම හෝ සොකරම් කිරීම හේතුකොට ගෙන ඒ වෙනුවෙන් ප්‍රතිස්ථාපන කාඩ්පතක් කාඩ්පත දරන්නා වෙත නිකුත් කිරීමේ බැඳීමක් බැංකුවට නොමැත. නිකුත් කරනු ලබන ඕනෑම ප්‍රතිස්ථාපන කාඩ්පතක් වෙනුවෙන් බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව පරිහරණ ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කරනු ඇති අතර, එවැනි ප්‍රතිස්ථාපනය කිරීමක් බැංකුවේ අභිමතය පරිදි සමාන කොන්දේසි සහ නියමයන් යටතේ හෝ බැංකුවට යෝග්‍ය යැයි හැඟෙන මුල් කාඩ්පතට වෙනස් කොන්දේසි සහ නියමයන් යටතේ සහ, සමාන හෝ වෙනස් ගිණුම් අංකයක් යටතේ සිදුකරනු ඇත.

13. පොදු

13.1 කාඩ්පත දරන්නාගේ රැකියාවේ යම් වෙනසක් හෝ කාර්යාලයේ සහ/හෝ නිවසේ ලිපිනයේ හෝ දුරකථන අංකවල යම් වෙනස්වීමක් සිදුවුවහොත් වහාම ඒ බැව් අදාල ලේඛනමය සාධක සහිතව බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත කාඩ්පත දරන්නා විසින් දැනුම්දිය යුතු ය.

13.2 කාඩ්පත දරන්නා වෙත ලබාදිය යුතු යම් දැනුම්දීමක් හෝ ලිපි කටයුතු කාඩ්පත දරන්නා විසින් අවසන් වරට බැංකුව වෙත ලිඛිතව ලබාදී ඇති ලිපිනය ඔස්සේ තැපැල් කරනු ඇති අතර, එය තැපැල් කරනු ලැබූ අවස්ථාවේ සිය පැය 48 ක් තුළ ලැබුණා යැයි සලකනු ඇත.

13.3 කාඩ්පත් ගිණුමෙහි තිබෙන හිඟ මුදල සම්පූර්ණයෙන්ම හෝ කොටසක් බැංකුවේ අභිමතය පරිදි ඕනෑම ආකාරයකින් මාරු කිරීමට, පැවරීමට හෝ විකිණීමට බැංකුවට අයිතියක් ඇත. හිඟ මුදල් අයකර ගැනීමේ කාර්යය පිණිස තුන්වන පාර්ශවයේ එකතු කිරීමේ නියෝජිතයින් පත්කිරීමට අවශ්‍ය අවසරය කාඩ්පත දරන්නා විසින් බැංකුවට මෙයින් ලබා දේ. හිඟ මුදල් අයකර ගැනීමට එකතු කිරීමේ නියෝජිත වෙත යොමු කිරීම අවශ්‍ය වුවහොත් හෝ ගෙවීම බලාත්මක කිරීම පිණිස අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග හේතුකොට ගෙන එසේ හිඟ මුදල් එකතු කිරීමට අදාල සියලුම වියදම් පොලී මුදල්, නෛතික ගාස්තු සහ එකතු කිරීමේ නියෝජිත ගාස්තු ආදි සියල්ල කාඩ්පත දරන්නා විසින් ගෙවිය යුතු ය.

13.4 බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන ඕනෑම අවස්ථාවක සිය මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් වන දත්ත කාඩ්පත දරන්නා විසින් බැංකුව වෙත ලබාදිය යුතු ය. තවදුරටත්, එසේ ලබාදෙන ලද තොරතුරු සත්‍යායනය කිරීමට අවශ්‍ය අවසරය කාඩ්පත දරන්නා බැංකුව වෙත ලබාදිය යුතු ය. ඉල්ලා සිටිනු ලබන අවස්ථාලදී එවැනි දත්ත ලබා නොදුන හොත් බැංකුවේ අභිමතය පරිදි සහ බැංකුවට මැනවැයි හැඟෙන පරිදි වහාම ක්‍රියාත්මක වන පරිදි කාඩ්පත අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ කාඩ්පත අවලංගු කිරීමට බැංකුව විසින් කටයුතු කරනු ඇති අතර, එවැනි අවලංගු කිරීමකදී කාඩ්පත් ගිණුමෙහි තිබෙන මුළු හිඟ මුදල කාඩ්පත දරන්නා විසින් බැංකුව වෙත වහාම ගෙවිය යුතු ය.

13.5 කාඩ්පත දරන්නා විසින් ලබාදී ඇති ලිපිනයට තැපැල් කරනු ලබන කාඩ්පත දරන්නාගේ ගිණුම් ප්‍රකාශ සහ/හෝ ලිපි ලේඛන නොලැබී ආපසු පැමිණෙන අවස්ථාවලදී හෝ කඩ්පත දරන්නා ඇමතිය නොහැකි අවස්ථාවලදී ඉල්ලුම්පත්‍රයේ නම් කර ඇති වෙනත් ලිපිනයකට ඒවා ආපසු හරවා ලැබීමේ අයිතිය බැංකුවට ඇත.

13.6 කාඩ්පත් ගිණුම අසතුටුදායක ලෙස පවත්වාගෙන යන්නේ නම් කාඩ්පත දරන්නා වෙත පූර්ව දැනුම්දීමක් සහිතව හෝ රහිතව කාඩ්පත සඳහා ආරම්භයේදී ලබාදී ඇති ණය සීමාව අඩුකිරීමට සහ/හෝ එය අලුත් කිරීම නතර කිරීමට බැංකුවට අයිතිය ඇත.

13.7 මෙම ගිවිසුමෙන් සපයා ඇති අයිතිවාසිකම් සහ පිළියම් සමුච්චිත වන අතර, යම් වෙනත් අයිතිවාසිකම් හෝ පිළියම්වලින් (නීතියෙන් හෝ වෙනත් හැටියකින් සපයා ඇතත්) බැහැර නොවේ.

13.8 කාඩ්පත දරන්නා විසින් යම් ගනුදෙනුවක්/ගනුදෙනු සම්බන්ධයෙන් ආරවුල් කරන්නේ නම්, බැංකුව විසින් එවැනි ආරවුල් කිරීම් විමර්ශනයට ලක් කරනු ඇත. කෙසේ වෙතත්, කාඩ්පත දරන්නා විසින් නීතිමය ක්‍රියාමාර්ග පසුපස යෑමට බලාපොරොත්තු නොවන්නේ නම් හෝ විමර්ශන කටයුතුවලට සහාය දැක්වීම පිණිස බැංකුව වෙත නොඑන්නේ නම් හෝ පියවු පරිපථ රූපවාහිනිය (CCTV) හෝ යම් වෙනත් සාක්ෂි නිරීක්ෂණය කිරීමට බලාපොරොත්තු නොවන්නේ නම් හෝ විමර්ශනය සිදුකරනු ලබන අවස්ථාවේදී වෙළඳ ආයතන වෙත හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) වෙත යෑමට බලාපොරොත්තු නොවන්නේ නම් එකී ආරවුල් සහගත සියලුම ගනුදෙනු සඳහා වගකීම කාඩ්පත දරන්නා විසින් භාරගත යුතු ය.

13.9 කාඩ්පත දරන්නාට හෝ යම් වෙනත් පුද්ගලයෙකුට විරුද්ධව සිදුකරනු ලබන උසාවි කටයුත්තකදී සාක්ෂි වශයෙන් භාවිතා කිරීමද ඇතුළුව බැංකුවට යෝග්‍ය යැයි හැඟෙන ඕනෑම කාර්යයක් වෙනුවෙන් භාවිතා කිරීම සඳහා කාඩ්පත දරන්නා දරන්නා සහ බැංකුව අතර සිදුවන දුරකථන ඇමතුම් (දුරකථන බැංකු පහසුකම් හරහා හෝ වෙනත් හැටියකින් වුවද) පටිගත කිරීමට සිය කැමැත්ත කාඩ්පත දරන්නා මෙයින් ප්‍රකාශ කර සිටී.

13.10 මෙම ගිවිසුම යටතේ යම් අයිතිවාසිකමක් හෝ පිළියමක් යෙදවීමේදී බැංකුව අසමත්වීම හෝ බැංකුවේ පාර්ශවයෙන් සිදුවන යම් ප්‍රමාදයක් එවැනි අයිතිවාසිකම් හෝ පිළියම් අත්හැරීමක් ලෙස ක්‍රියා නොකරනු ලබන අතර.

13.11 මෙම ගිවිසුමේ දැක්වෙන යම් නියමයක් උදෙසා හෝ මෙම ගිවිසුම කාඩ්පත දරන්නා විසින් උල්ලංඝනය කිරීම හේතුකොට ගෙන බැංකුවේ අයිතිවාසිකම් හෝ පිළියම්, බැංකුව විසින් සිදුකරනු ලබන යම් අත්හැරීමක් ලිඛිතව සිදුවිය යුතු අතර, අප විසින් යෝග්‍ය සහ මැනවැයි සලකනු ලබන පරිදි සහ සිද්ධියට පමණක් බලපාන සහ එකී කාර්යය සඳහා දෙනු ලබන එවැනි කොන්දේසි සහ නියමයන් එකී කාර්යය සඳහා පමණක් බලාත්මක වනු ඇත.

13.12 කාඩ්පත දරන්නාට, යම් කාඩ්පත් ගනුදෙනුවකට, ණයවර කාඩ්පතට සහ/හෝ කාඩ්පත දරන්නාගේ කාඩ්පත් ගිණුමට අදාල සියලුම කරුණු සම්බන්ධයෙන් බැංකුව සතු වාර්තා (පරිගණක සහ සූක්ෂ්ම චිත්‍රපටද ඇතුළුව) එවැනි කරුණුවල තීරණාත්මක සාක්ෂි වන අතර, බැංකුවේ අයිතිවාසිකමට යටත්ව යම් දෝෂයක් නිවැරදි කිරීම හෝ එයින් මගහැරීම සහ අනිකුත් සාක්ෂි ඉදිරිපත් කිරීමට බැංකුවේ අයිතියට යටත්ව ඒවා සියලුම කාර්යයන්හිදී, ව්‍යක්ත දෝෂ සඳහා බේරීම යන කාරණයේදී ඔබට විරුද්ධව බැඳේ. බැංකුව විශ්වාසය තබා ඇති ඕනෑම කාර්යයක් වෙනුවෙන් බැංකුව සතු යම් පරිගණක නිමැවුමක සත්‍යතාවය හෝ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් කිසිඳු අවස්ථාවක හබ නොකරන බවට කාඩ්පත දරන්නා මෙයින් එකඟ වේ. බැංකුවේ පරම අභිමතය පරිදි සහ බැංකුවට යෝග්‍ය යැයි හැඟෙන පරිදි යම් කාඩ්පත් ගනුදෙනුවක් හෝ කාඩ්පත් ගිණුමක් සම්බන්ධයෙන් එවැනි ආකාරයකින් පටිගත කරනු ලබන සූක්ෂ්ම චිත්‍රපට හෝ වෙනත් හැටියකින් තිබෙන වාර්තා ඕනෑම අවස්ථාවක විනාශ කිරීමේ අයිතිය බැංකුව සතු වේ.

13.13 කාඩ්පත් ගිණුමට අදාලව කාඩ්පත දරන්නා වෙත බැංකුව විසින් කලින් කලට ලබාදී ඇති පහසුකම්, ප්‍රතිලාභ හෝ සේවාවන් භාවිතා කිරීම පාලනය කරනු ලබන සියලුම කොන්දේසි සහ නියමයන් ("අනිකුත් කොන්දේසි සහ නියමයන්") සමඟ බැඳෙන බවට කාඩ්පත දරන්නා එකඟ වන අතර, ඒවා කලින් කලට සංශෝධනය හෝ වෙනස් කළ හැකි ය. ණයවර කාඩ්පතට අදාලව මෙම ගිවිසුම සහ අනිකුත් කොන්දේසි සහ නියමයන් අතර යම් ගැටුමක් වෙතොත්, මෙම ගිවිසුමේ දැක්වෙන ප්‍රතිපාදන බලපැවැත්වීම පිණිස අවශ්‍ය යැයි හැඟෙන පරිදි සහ බැංකුව විසින් සලකනු ලබන පරිදි මුලින් කී දේ බලාත්මක වනු ඇති අතර, පසුව කියනු ලබන දේ වෙනස් කිරීමට යටත්ව අපගේ අයිතිවාසිකම් බලාත්මක වීමට සහ එහි වලංගුභාවයට ගිවිසුමේ දැක්වෙන පිළියම් යටතේ දැක්වෙන කොන්දේසි සහ නියමයන් අඛණ්ඩව අදාල කරගත යුතු ය.

14. දුරකථන, ටෙලෙක්ස්, අනුචිත්‍ර සහ විද්‍යුත් තැපැල් මගින් දෙනු ලබන උපදෙස් සඳහා අවසරදීම සහ ඒවායින් වගකීමෙන් වන නිදහස

14.1 කාඩ්පත දරන්නා විසින් හෝ ඔහු/ඇය වෙනුවෙන් දුරකථනය, ටෙලක්ස් පණිවුඩයක්, ෆැක්ස් පණිවිඩයක් හෝ විද්‍යුත් තැපැල ඔස්සේ කලින් කලට දෙනු ලබන හෝ ලබාදීමට අදහස් කරනු ලබන දැන්වීම්, උපදෙස්, ඉල්ලීම් හෝ අනිකුත් සන්නිවේදන (“සන්නිවේදන”) කෙරෙහි බැංකුවේ පාර්ශවයෙන් කිසිඳු විපරම් කිරීමකින් තොරව ඉහත දැක්වූ කරුණුවල පොදුභාවයට අගති රහිතව විශ්වාසය තබන ලෙසට කාඩ්පත දරන්නා විසින් බැංකුවට බලය ලබාදෙන අතර, එසේ උපදෙස් දෙනු ලබන හෝ ලබාදීමට අදහස් කරනු ලබන පුද්ගලයාගේ අවසරය හෝ අනන්‍යතාවය සහ එකී උපදෙස් ලබාගන්නා අවස්ථාවේදී පවත්නා තත්ත්වය සැලකිල්ලට නොගනු ඇත. උපදෙස් ලබාගන්නා කාලය/දිනය මත බැංකුවේ රීති නියමයන් අවසන් ඒවා වශයෙන් කාඩ්පත දරන්නා විසින් පිළිගනු ඇත.

14.2 කාඩ්පත දරන්නා විසින් බැංකුව වෙත ලබාදෙන ලද සහ බැංකුව සමහ බැඳී ඇති උපදෙස් සලකා බැලීමට බැංකුවට අයිතියක් ඇති අතර, එකී උපදෙස් කාඩ්පතේ කාර්යය පිණිස සුදුසුද නැත්ද යන්න බැංකුවට යෝග්‍ය සහ මැනවැයි හැඟෙන පරිදි ඒ මත රඳා පැවතීමටත් එවැනි පියවර ගැනීමටත් බැංකුවට අයිතියක් ඇත. කිසියම් ගිණුමක් හර කිරීම හෝ බැර කිරීම සඳහා මුදල් ගෙවීම හෝ වෙනත් ලියකියවිලි ලබාදීම සහ ඒ හා සම්බන්ධවීම හෝ බැංකුව හෝ වෙනත් පුද්ගලයෙකු සමහ ඇතිකරගත් ගිවිසුමකට හෝ විධිවිධානයකට කාඩ්පත දරන්නා යටත් කිරීමට බැංකුවට අයතියක් ඇත. ගනුදෙනුවේ ස්වභාවය හෝ ඊට අදාල විධිවිධාන සහ මුදල් ගණන කුමක් වුවත් ඇතිවන කිසියම් දෝෂයක්, අවිනිශ්චිතතාවයක්, වරදවා වටහා ගැනීමක් හෝ උපදෙස්වල තිබෙන අපැහැදිළි බව සම්බන්ධයෙන් බැංකුවට බැඳීමක් නොපවතී.

14.3 මෙකී බලයපැවරීමේ කොන්දේසි හා උපදෙස් වලට අනුකූලව බැංකුව ක්‍රියාකිරීම සැලකිල්ලට ගනිමින්, කාඩ්පත් හිමියා විසින් බැංකුවට වන්දිපූරණය කිරීමට සහ කාඩ්පත දරන්නා විසින් බැංකුව වෙත සිදු කරන ලද පාඩු, හිමිකම්, ක්‍රියා, ක්‍රියාමාර්ග, ඉල්ලීම්, හානි, පිරිවැය සහ වියදම් සම්බන්ධයෙන් කාඩ්පත දරන්නා බැංකුවට වගකිව යුතු බවට කාඩ්පත දරන්නා එකඟ වේ.

14.4 කාඩ්පත්හිමියාවෙතලබාදෙනුලබනසේවාවන්අත්හිටුවීම පිළිබඳ දැනුම් දීමක් බැංකුවට ලැබෙන තෙක් සහ එය ක්‍රියාත්මක වීමට සාධාරණ කාලයක් තිබේ නම් මිසක, මෙම බලය පැවරීමේ හා වන්දි ගෙවීමේ නියමයන් පූර්ණ ලෙස හා බලාත්මකව පවතිනු ඇත. එවැනි අවලංගු කිරීමකින් පසුව ඊට අදාල කාලපරිඡ්දය අවසන්වීමට ප්‍රථම මෙකී බලය පැවරීමේ සහ හානිපූරණය කිරීමේ කොන්දේසිවලට අනුකූලව සිදුකරනු ලබන ඕනෑම ක්‍රියාවකින් කාඩ්පත දරන්නා නිදහස් නොවනු ඇත.

**15.** අභිමතය

15.1 අපගේඅයිතිවාසිකම් හෝ පිළියම්වලට අගති රහිතව කිසිඳු හේතුවක් හෝ දැනුම්දීමක් නොමැතිව යෝජිත කාඩ්පත් ගනුදෙනුව අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට අයිතියක් ඇත. එහිදී අදාල කාඩ්පත් ගනුදෙනුව හර කර ඇත්ද, එහි වර්තමාන ශේෂයක් තිබේද යන්න අදාල නොවනු ඇති අතර, කාඩ්පත වෙනුවෙන් ලබාදී ඇති ණය සීමාව ඉක්මවා නොයනු ඇත.

15.2 එතෙකුදු වුවත් මෙම ගිවිසුමේ දැක්වෙන අනිකුත් ප්‍රතිපාදනයන්ට අගති රහිතව ජංගම ශේෂය විසින් ණය සීමාව ඉක්මවා යා හැකි ඕනෑම කාඩ්පත් ගනුදෙනුවකට අවසර දීමට හෝ අනුමැතිය ලබාදීමට බැංකුවට හැකියාව ඇත.

15.3 එතෙකුදු වුවත් මෙම ගිවිසුමේ දැක්වෙන අනිකුත් ප්‍රතිපාදනයන්ට අගති රහිතව, බැංකුවේ සහ අපගේ පරම අභිමතය පරිදි දැනුම්දීමක් රහිතව සහ කිසිඳු හේතුවක් නොදන්වා පහත දැ සිදුකිරීම බැංකුවට හිමිකම ඇත.

15.3.1 කාඩ්පත සම්පූර්ණයෙන්ම හෝ යම් විශේෂිත පහසුකමක් භාවිතා කිරීමට කාඩ්පත දරන්නාට තිබෙන අයිතිවාසිකම අත්හිටුවීමට සහ/හෝ

15.3.2 ණය සීමාව අඩු කිරීමට සහ/හෝ

15.3.3 කාඩ්පතක් නැවත නිකුත් කිරීම, අලුත් කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම ප්‍රතික්ෂේප කිරීමට සහ/හෝ

15.3.4 කාඩ්පත් ගිණුමට හෝ කාඩ්පත දරන්නාට අදාළව හෝ සියලුම හෝ විශේෂිත කාඩ්පත් දරන්නන් සඳහා ප්‍රතිලාභ, සේවාවන්, පහසුකම් සහ වරප්‍රසාද හඳුන්වාදීම, ඒවා සංශෝධනය කිරීම, වෙනස් කිරීම, සීමා කිරීම, අතහිටුවීම හෝ ඉවත් කිරීම.

15.4 කාඩ්පත දරන්නාගේ ඉල්ලීම පරිදි බැංකුව විසින් ඕනෑම වේලාවක සුදුසු යැයි සලකන පරිදි කිසිදු බැඳීමක් හෝ හේතුවක් නොමැතිව කාඩ්පත දරන්නා වෙත දැනුම්දීමක් සහිතව කාඩ්පත් ගිණුම් අංකය වෙනස් කිරීමට බැංකුවට අයිතියක් ඇත. තවද ඉහත කී පරිදි නව කාඩ්පත් ගිණුමක් විවෘත කිරීම, අපේක්ෂිත කාඩ්පතක් නිකුත් කිරීම, වර්මාන ශේෂය සහ සියලුම බැරකම් ඇතොත් ඒවා මුල් කාඩ්පත් ගිණුමෙන් නව කාඩ්පත් ගිණුමට මාරු කිරීමට බැංකුවට අයිතිය ඇති අතර, එසේ මාරු කිරීමෙන් පසුව පැරණි කාඩ්පත කැබලි 4 කට කපා කාඩ්පත දරන්නා විසින් බැංකුව වෙත ආපසු ලබාදිය යුතු ය.

15.5 මෙම ගිවිසුම යටතේ ඇති කාඩ්පත දරන්නාගේ බැඳීම් හා වගකීම්, කාඩ්පත් ගිණුම සහ මෙම ගිවිසුම වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේදී බලපෑමක් සිදු නොවනු ඇත. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම්, මේ සම්බන්ධයෙන් කාඩ්පත දරන්නා විසින් ලිඛිතව දැනුම්දීමක් සිදු නොකරන්නේ නම්, කාඩ්පත ගිණුම සහ සිදුකරනු ලබන එවැනි හර කිරීම් අඛණ්ඩව පවතිනු ඇත.

16. නිදහස් කිරීම සහ බැහැර කිරීම

16.1 යම් වෙළඳායතනයක් විසින් කාඩ්පතට ගරු කිරීම, භාරගැනීම හෝ ණය පහසුකම් සම්පූර්ණයෙන්ම සහ අවසරලත් ණය සීමාව දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් වගකීමක් බැංකුව විසින් භාරනොගනු ඇත.

16.2 කාඩ්පත හෝ කාඩ්පත් අංකය භාවිතා කරමින් දෙනු ලබන භාණ්ඩ සහ/හෝ සේවාවන්හි යම් අඩුපාඩුවක් හෝ ඌනතාවයන් සිදුවුවහොත් බැංකුව ඒ සම්බන්ධයෙන් වගනොකියනු ඇත. භාණ්ඩ සහ/හෝ සේවාවන් විකිණීම හෝ පරිභෝජනය කිරීම අරමුණු කරගෙන යොදාගනු ලබන වෙළඳ දැන්වීම්, පොත්, සඟරා, තැපැල් අණවුම් පෝරම, පොත් පිංච හෝ අනිකුත් ලේඛන මගින් නිර්මාණය කරනු ලබන හෝ ඒවායෙහි අඩංගු වන ප්‍රකාශ, වචන, පින්තූර හෝ අනිකුත් ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් බැංකුව වගනොකියනු ඇත. වෙළෙන්දාට විරුද්ධව තිබෙන පැමිණිලි, කාඩ්පත දරන්නා විසින් වෙළඳායතනය සමඟ බේරුම් කරගත යුතු අතර, මෙහි පහත දැක්වෙන පරිදි බැංකුවේ යම් වගකීමකින් සහනය සලසනු ලබන වෙළඳායතනයට එරෙහිව කාඩ්පත දරන්නා විසින් හිමිකම් නොකිව යුතු ය.

16.3 බැංකුවේ පාලනයෙන් එහා ගිය හෝ වෙනත් හැටියකින් යම් ස්වංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ඒටීඑම්) කඩාකප්පල් කිරීම හෝ ඒවා ඇනහිටීම හෝ ඒවායෙහි යම් දෝෂයක් හේතුකොට ගෙන හටගන්නා හෝ සන්නිවේදන පද්ධතියක හෝ පහසුකමක හෝ දත්ත සැකසුම් පද්ධතියක හෝ සම්ප්‍රේෂණ සම්බන්ධතාවයක හෝ යම් කාර්මික හෝ වෙනත් ආරවුලක් හේතුකොට ගෙන කාඩ්පත දරන්නාට සිදුවිය හැකි යම් අපහසුතාවයක්, පාඩුවක් හෝ ඕනෑම ස්වභාවයක දුෂ්කරතාවයක් සම්බන්ධයෙන් කිසිඳු ආකාරයක වගකීමක් බැංකුව විසින් භාරනොගනු ඇත.

16.4 යම් යන්ත්‍රයක හෝ සන්නිවේදන පද්ධතියක ඍජුව හෝ වක්‍රව සිදුවන ඇනහිටීමක්, කාඩ්පතෙහි තිබෙන දෝෂයක් හෝ හානියක්, කාර්මික ආරවුලක්, යුධමය තත්ත්වයක්, දේවක්‍රියා, හෝ බැංකුවේ සේවකයින්ගේ හෝ නියෝජිතයින්ගේ පාලනයෙන් බැහැරව සිදුවන යම් වෙනත් හේතුවක් නිසා මෙම ගිවිසුම යටතේ බැංකුව පාර්ශවයෙන් සිදුවිය යුතු කාර්යයන් ඉෂ්ඨ කිරීමට නොහැකි වුවහොත් ඒ සඳහා බැංකුව වගනොකියනු ඇත.

16.5 ගිණුම් ප්‍රකාශ දිනය සහ ගෙවීම සිදුකළ යුතු දිනය සඳහා එක් එක් මාසයේ දිනයක් බැංකුව විසින් තෝරාගනු ඇත. කාඩ්පත දරන්නා වෙත ගිණුම් ප්‍රකාශයක් යැවීමට බැංකුව අපොහොසත් වුවහොත් ගෙවිය යුතු මුලා ගාස්තුද ඇතුළුව කාඩ්පත දරන්නගේ වගකීම් අඛණ්ඩව පවතිනු ඇත.

16.6 කාඩ්පත මත කාවද්දන පරිදි මුද්‍රණය කර ඇති හෝ අනිකුත් නෙරා ඇති පරිදි මුද්‍රිතවල ප්‍රත්‍යුත්පාදන හෝ කේතාංකනය කරමින් අඩංගු කර ඇති තොරතුරු දරනු ලබන යම් විකුණුම් ණයවර, ගනුදෙනු වාර්තා, ණයවර වවුචර්පත්, මුදල් විසැඳුම් ණයවරපත් සහ/හෝ අනිකුත් ගාස්තු අයකිරීමේ වාර්තාවලට බැංකුව ගරු කළ යුතු ය. මෙම ක්‍රියාවලියේදී එවැනි ගාස්තු අයකිරීම්වල දැක්වෙන අත්සන් හෝ අඩංගු දෑ සත්‍යායනය කිරීමට බැංකුවට බැඳීමක් නොමැත.

16.7 සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් බැංකුව සතුව පවතින වාර්තා, විකුණුම් තුණ්ඩු සහ ගිණුම් ප්‍රකාශ තීරණාත්මක වන බවටත්, ඒවා සියලුම කාර්යයන් සඳහා කාඩ්පත දරන්නා මත බැඳෙන බවටත් කාඩ්පත දරන්නා එකඟ වේ.

16.8 බැංකුවේ පොත් පිංච, නිවේදන හෝ ප්‍රකාශනවල දැක්වෙන දැන්වීම්වල සඳහන් පරිදි සේවාවන්, නිෂ්පාදන හෝ ප්‍රතිලාභ ලබාදීම යම් ඇනහිටීමක් හේතුකොට ගෙන හෝ ඊට අනුෂංගික වශයෙන් කෙසේ හෝ හටගන්නා ඕනෑම ස්වභාවයක ඕනෑම හිමිකමක් සඳහා බැංකුව විසින් කාඩ්පත දරන්නා වෙත කිසිඳු ආකාරයකින් වගකීමක් නොදරනු ඇත.

16.9 මෙම ගිවිසුමෙන් පාලනය කරනු ලබන හෝ ප්‍රකල්පිත යම් ද්‍රව්‍ය හෝ ගනුදෙනු සිදුකිරීම හෝ ප්‍රසම්පාදනය කිරීම සඳහා භාවිතා කිරීමට යෝග්‍ය යැයි බැංකුව විසින් සලකනු ලබන නියෝජිතයින්, කොන්ත්‍රාත්කරුවන් හෝ ලිපි කටයුතු බැංකුවේ පරම අභිමතය පරිදි එසේ භාවිතා කළ හැකි බවට ඔබ එකඟ වන අතර, එවැනි නියෝජිතයින්ගේ, කොන්ත්‍රාත්කරුවන්ගේ සහ/හෝ ලිපි කටයුතු පාර්ශවයෙන් සිදුවන යම් ක්‍රියාවක්, ප්‍රමාද දෝෂයක්, නොසලකා හැරීමක් හෝ සිතා මතා සිදුකරනු ලබන වැරැද්දක් වෙනුවෙන් බැංකුව කාඩ්පත දරන්නා වෙත වග නොකියනු ඇත.

17. වගකීමෙන් වන නිදහස

17.1 මෙහි පහත දැක්වෙන කරුණුවල පොදුභාවයට අගති රහිතව කාඩ්පත දරන්නා විසින්, ඔහුගේ/ඇයගේ කාඩ්පත් ගිණුම සහ/හෝ මෙම ගිවිසුම හේතුකොට ගෙන හෝ ඒ සම්බන්ධයෙන් බැංකුවට දැරීමට හෝ විඳීමට සිදුවන යම් පාඩුවක්, හානියක්, වගකීමක්, පිරිවැයක් සහ වියදමක් (පූර්ණ හානි රක්ෂණ පදනම මත නෛතික ගාස්තුද ඇතුළුව) නිසා සිදුවන උපද්‍රවකාරී තත්ත්වයන්ගෙන් පූර්ණ වශයෙන් බැංකුව මුක්තිදානය කළ යුතු ය. එනම්,

17.1.1 මෙම ගිවිසුම යටතේ කාඩ්පත දරන්නාගේ වගකීම්වලින් එකක් හෝ වැඩි ගණනක් උල්ලංඝනය කිරීම.

17.1.2. කාඩ්පත දරන්නාට එරෙහිව බැංකුවේ අයිතිවාසිකම් සහ පිළියම්වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් තථ්‍ය හෝ බලාත්මක කිරීමට තැත් කිරීම හෝ ආරක්ෂා කිරීම සහ/හෝ

17.1.3 කාඩ්පත, කාඩ්පත් ගිණුම සහ/හෝ මෙම ගිවිසුම මත බලපෑ හැකි යම් නීතියක, රෙගුලාසියක හෝ නිල විධානයක වෙනස්වීමක් සහ, එය කාඩ්පත දරන්නාගේ කාඩ්පත් ගිණුමට හර කිරීම සහ/හෝ ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක කාඩ්පත දරන්නා විසින් ගෙවිය යුතු ය.

17.1.4 දත්ත ඉලෙක්ට්‍රෝනිකව මාරු කිරීමේදී ඒවා නැතිවීම සහ/හෝ අවනිර්දේශනයවීම.

18. නෛතික ක්‍රියාමාර්ග

කිසියම් හේතුවක් නිසා කාඩ්පත දරන්නා මෙම ගිවිසුමෙහි දැක්වෙන කොන්දේසි සහ නියමයන්ට අනුකූලවීමට අපොහොසත් වුවහොත් බැංකුව විසින් මෙම කාඩ්පත් ගිවිසුම අවසන් කොට නෛතික ක්‍රියාමාර්ග හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන යම් වෙනත් විකල්ප ආරවුල් විසඳාගැනීමේ ක්‍රමයක් උපයෝගී කොටගෙන කාඩ්පත් ගිණුම යටතේ බැංකුවට ගෙවිය යුතු සියලුම හිඟ මුදල් අයකර ගැනීමට බැංකුව විසින් කටයුතු කරනු ඇත. එහිදී බැංකුවට දැරීමට සිදුවන නෛතික ගාස්තු ඇතුළු සියලුම පිරිවැය, ගාස්තු අයකිරීම් සහ වියදම් වෙනුවෙන් වගකීම, කාඩ්පත දරන්නා විසින් පූර්ණ හානිරක්ෂණ පදනම මත දැරිය යුතු ය.

19. විනිමය පාලන රෙගුලාසි

19.1 සෑම විටම කාඩ්පත දරන්නා සිය කාඩ්පත 2017 අංක 12 දරණ විදේශ විනමය පනතේ සහ කලින් කලට ප්‍රසිද්ධ කරනු ලබන යම් වෙනත් ගැසට් දැන්වීම්වල දැක්වෙන ප්‍රතිපාදනවලිට සහ මෙහි පහත දක්වා ඇති සියලුම මෙහෙයුම් උපදෙස්වලට අනුකූලව භාවිතා කිරීමට වගබලාගත යුතු ය.

19.2 බැංකුව, කලින් කලට ගිවිස ගන්නා පරිදි විනිමය පාලකගේ හෝ යම් වෙනත් නියාමක අධිකාරියක වාර්තා කිරීමේ අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කරනු ඇත.

19.3 කාඩ්පත දරන්නා විසින් විනිමය පාලන රෙගුලාසි උල්ලංඝනය කර ඇති බවට විශ්වාස කළ හැකි ඕනෑම හේතුවක් මත කාඩ්පත දරන්නා/දරන්නන් වෙත දැනුම්දීමක් නොකර බැංකුව විසින් කාඩ්පත/කාඩ්පත් අවලංගු කරනු ඇත.

19.4. කාඩ්පත දරන්නා විසින් කාඩ්පත විදේශ රටකදී භාවිතා කළ යුත්තේ ගමන් බිමන්, නවාතැන්, වෛද්‍ය ප්‍රතිකාර, ජීවත්වීම, ලියාපදිංචි ගාස්තු ගෙවීම, විභාග ගාස්තු සහ විදේශ රටක ආයතනයක් හෝ අධ්‍යයන ආයතනයක් සඳහා පෞද්ගලික ස්වභාවයේ වාර්ෂික දායක ගාස්තු ගෙවීම, පෞද්ගලික භාවිතය සඳහා භාණ්ඩ මිළදී ගැනීමේදී ගෙවීම් සිදුකිරීම, ගමන් බිමන් සඳහා රක්ෂණ වාරික සහ පෞද්ගලික ස්වභාවයේ සෞඛ්‍ය රක්ෂණ ගාස්තු සහ/හෝ විද්‍යුත් තැපැල, අන්තර්ජාලය, දුරකථනය ඔස්සේ සිදුකරනු ලබන ගනුදෙනු එනම් විදේශ මුදල්වලින් බිල්පත් කරනු ලබන ගමන් වියදම්, හෝටල් වියදම්, ආනුෂංගික වියදම්, වෛද්‍ය වියදම් සහ පෞද්ගලික භාවිතය සඳහා භාණ්ඩ මිළදී ගැනීම වැනි පෞද්ගලික භාවිතයට අදාල කාරණා සඳහා පමණි. කාඩ්පත, ප්‍රාග්ධන ගනුදෙනු සහ ආනයනය සඳහා භාණ්ඩ වාණිජමය ප්‍රමාණවලින් මිළට ගැනීම වැනි ගෙවීම් කටයුතු සඳහා භාවිතා නොකළ යුතු ය.පෞද්ගලික පරිහරණය සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා ගෙවීම්, නියාමකය විසින් පිරිවැය රක්ෂණ ගැල්බර ((Cost Insurance Freight (C.I.F)) මත කලින් කලට සඳහන් කර ඇති පරිදි උපරිමව සීමා කරනු ලැබේ."පෞද්ගලික පරිහරණය" යනුවෙන් අදහස් කරනු ලබන්නේ කාඩ්පත, කාඩ්පත දරන්නා, ඔහුගේ/ඇයගේ කලත්‍රයා සහ දරුවන් සහ දෙමව්පියන් විසින් භාවිතා කිරීම වන අතර, ඒ සඳහා කිසිඳු වාණිජමය කාර්යයක් සඳහා භාවිතා කිරීම ඇතුළත් නොවේ.

19.5 ඉහත දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රුපියල්වලින් විදේශ රටක මුදලකට පරිවර්තනය කිරීමට සිදුවිය හැකි කිසිඳු ගනුදෙනුවක් කිරීම සඳහා කිසිඳු පාර්ශවයක් විසින් කාඩ්පත භාවිතා කිරීමට ඉඩ නොදීමට කාඩ්පත දරන්නා වගබලා ගත යුතු ය.

19.6 කාඩ්පත දරන්නා සංක්‍රමණය කරන්නේ නම්, විදේශ රටක රැකියාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන්නේ නම් හෝ දැනට බලපවත්නා සහ කලින් කලට සංශෝධනය විය හැකි විදේශ විනිමය පනතට අනුව කාඩ්පත දරන්නා 'අනේවාසික' පුද්ගලයෙකු ලෙස අර්ථ දක්වනු ලබන අවස්ථාවකදී කාඩ්පත දරන්නා විසින් කාඩ්පත/කාඩ්පත් බැංකුව වෙත භාරදිය යුතු ය.

19.7 කාඩ්පත දරන්නා, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය අධ්‍යක්ෂකවරයාගේ හෝ කලින් කලට නියම කරනු ලබන යම් වෙනත් නියාමන අධිකාරියක වාර්තා කිරීමේ අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය.

19.8 එතෙකුදු වුවත් මෙම ගිවිසුම අවසන් කිරීමට හෝ වෙනත් කරුණක් උදෙසා එහි දැක්වෙන යම් ප්‍රතිපාදනවලට අනුකූලව, දැනට බලපවත්නා විදේශ විනිමය පනතේ දැක්වෙන ප්‍රතිපාදන/අවශ්‍යතා කාඩ්පත දරන්නා විසින් උල්ලංඝනය කර ඇති බවට විශ්වාස කළ හැකි යම් හෝ ඕනෑම හේතුවක් පදනම් කරගෙන බැංකුවේ කැමැත්ත මත කාඩ්පත දරන්නා/දරන්නන් වෙත දැනුම්දීමක් නොකර වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම ගිවිසුම අවසන් කිරීමට සහ/හෝ අවලංගු කිරීමට සහ/හෝ කාඩ්පත/කාඩ්පත් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට අයිතියක් ඇත.

20. මෙම ගිවිසුමෙහි බලපැම

20.1 මෙම කොන්දේසි සහ නියමයන් කලින් කලට වෙනස් කිරීමේ හෝ අලුතින් කොන්දේසි සහ නියමයන් හඳුන්වාදීමේ අයිතිය බැංකුව සතු වේ (මෙහි පහත දක්වා ඇති සංශෝධිත ගාස්තු සහ ගාස්තු ගෙවීම්වලට හෝ අලුතින් නව ගාස්තු සහ ගාස්තු අයකිරීම් හඳුන්වාදීමට සීමා පැනවීමක් රහිතව යන කරුණද ඇතුළුව).

20.2 එවැනි වෙනස් කිරීමක් කාඩ්පත දරන්නා විසින් පිළිනොගන්නේ නම් එකී වෙනස් කිරීම බලාත්මක වන දිනට පසුව කාඩ්පත භාවිතා කිරීම මත එවැනි වෙනස් කිරීමක් නියම කිරීමකින් තොරව කාඩ්පත දරන්නා විසින් පිළිගනු ලැබුවා යැයි සැලකෙන අතර, එවැනි වෙනස් කිරීමක් බලාත්මකවීමට පෙර කාඩ්පත අවලංගු කිරීම පිණිස එය පරිපූරක කාඩ්පත/කාඩ්පත් සමඟ බැංකුව වෙත ආපසු භාරදිය යුතු ය.

20.3 සිය කාඩ්පත සහ යම් පරිපූරක කාඩ්පත්/කාඩ්පත් භාවිතා කරමින් සිදුකරනු ලබන කාඩ්පත් ගනුදෙනුවලින් (එතෙකුදු වුවත් මෙම ගිවිසුම යම් අවසන් කිරීමක් ද) කාඩ්පත දරන්නා විසින් බැංකුව නිදහස් කරනු ඇත.

21. තොරතුරු අනාවරණය කිරීම

කාඩ්පත් ගිණුමක් අවසන් කිරීමට පෙර හෝ අවසන් කරනු ලැබීමෙන් පසුව බැංකුවේ පවත්වාගෙන යනු ලබන හෝ කාඩ්පත දරන්නාට හෝ යම් කාඩ්පත් ගනුදෙනුවකට, හෝ කාඩ්පත් ගිණුමකට හෝ යම් වෙනත් ගිණුමකට අදාළ තොරතුරු මෙහි දැක්වෙන කරුණුවල පොදුභාවයට, දිවයින පුරා පිහිටි අපගේ ශාඛාවලට, අපගේ සේවකයින්ට, අපගේ ඒජන්තවරුන්ට, අපගේ නියෝජිතයින්ට, සහ/හෝ ස්වාධීන කොන්ත්‍රාත්තරුවන්ට, කාඩ්පත් ගිණුම මෙහෙයවීමට කාඩ්පත දරන්නා විසින් අවසරය ලබාදී යම් වෙනත් පුද්ගලයෙකුට, කාඩ්පත් ගිණුම සහ/හෝ එහි ගිවිසුම උදෙසා හෝ ඊට අදාලව යම් සේවාවන් හෝ පහසුකම් සැපයීමට, බලාත්මක කිරීමට, ක්‍රියාවේ යෙදවීමට හෝ සැපයීමට මැදිහත්ව සිටින යම් පුද්ගලයෙකුට, යම් වෙළඳ බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට, යම් රජයේ හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් ඔබ්බට පිහිටි ඒජන්සියකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ අධිකාරියකට සහ බැංකුවේ උනන්දුව මත බැංකුවට මැනවැයි හැඟෙන සහ සලකනු ලබන යම් වෙනත් පුද්ගලයෙකුට අගති රහිතව බැංකුවේ පරම අභිමතය පරිදි බැංකුවට උචිත යැයි හැඟෙන යම් තුන්වන පාර්ශවයකට අනාවරණය කිරීම පිණිස ඊට අදාල කැමැත්ත කාඩ්පත දරන්නා විසින් ලබාදිය යුතු ය.

22. හිලව් කිරීමේ අයිතිය සහ සුරක්ෂිත ලෙස රඳවාගන්නා මුදල්

22.1 හිළව් කිරීමට අදාල යම් පොදු අයිතිවාසිකම්වලට හෝ නීතිය හෝ යම් වෙනත් ගිවිසුමක් මගින් පවරා ඇති අයිතිවාසිකම්වලට අමතරව,

22.1.1 මෙම ගිවිසුම යටතේ ඔබ විසින් මෙයින් දෙනු ලබන කැමැත්ත පරිදි කාඩ්පත දරන්නාගෙන් බැංකුව වෙත පවතින වගකීම් සම්බන්ධයෙන් සෑහීමට පත්වීම කරනකොට ගෙන හෝ ඒ උදෙසා කිසිඳු ආකාරයකින් කාඩ්පත දරන්නා වෙත දැනුම්දීමක් රහිතව සහ වගකීමක් රහිතව කාඩ්පත දරන්නා විසින් බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් එකක් හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධ කර හෝ ඒකාබද්ධ කර එවැනි

ගිණුම්වල බැරට තිබෙන යම් මුදල් ගණනක් ඕනෑම අවස්ථාවක සහ කලින් කලට හිළව් කිරීමට, රඳවා තබා ගැනීමට, ඇවිරීමට, මාරු කිරීමට හෝ අදාල කරගැනීමට බැංකුවට හිමිකම ඇත.

22.1.2 ඉහත කී ආකාරයේ සම්බන්ධ කිරීමක්, ඒකාබද්ධ කිරීමක් සහ/හෝ හිළව් කිරීමක් කරණකොට ගෙන පවතින මුදල් වර්ගය වෙනත් මුදල් වර්ගයකට පරිවර්තනය කිරීමේදී එය බැංකුවේ සාමාන්‍ය පරිචයට අනුව එම අවස්ථාවේදී බලපැවැත්වෙන විනිමය අනුපාතවලට අනුව සිදුකිරීමට බැංකුවට හිමිකම ඇති අතර, එහිදී හටගත හැකි සියලුම විනිමය අවදානම්, පාඩු, කොමිස් මුදල් සහ අනිකුත් බැංකු ගාස්තු ආදී සියල්ල කාඩ්පත දරන්නා විසින් දැරිය යුතු ය.

22.2 ණයවර කාඩ්පතක් සපයනු ලබන අවස්ථාවේදී ඒ සඳහා සුරක්ෂිතයක් වශයෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි පවත්වාගෙන යනු ලබන ගිණුමක මුදල් තැන්පත් කරන ලෙසට බැංකුව විසින් කාඩ්පත දරන්නාගෙන් ඉල්ලා සිටිය හැකි ය. කාඩ්පත දරන්නාට දැනුම්දීමක් කිරීමෙන් හෝ කිසිඳු දැනුම්දීමක් නොකර කාඩ්පතෙහි තිබෙන හිඟ මුදල් ඉහතකී තැන්පත් මුදල්වලින් හිළව් කරගැනීමේ අයිතිය බැංකුව සතුව රඳවා තබාගනී. එකී තැන්පත් මුදල්වලට කාඩ්පත දරන්නා ප්‍රවේශ වන්නේ නම් ඒ බැව් ඔහු/ඇය විසින් බැංකුව වෙත කල්තියා දැනුම්දිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් තීරණයක් කාඩ්පත දරන්නා විසින් සිය ණයවර කාඩ්පත කෙසේ භාවිතා කරන්නේද යන කරුණ පදනම් කරගෙන බැංකුව විසින් ගනු ඇත.

23. මෙම ගිවිසුම බලැපැවැත්වීම

23.1 එතෙකුදු වුවත් මෙම ගිවිසුම අවසන් කිරීමේදී මෙහි දැක්වෙන සියලුම ප්‍රතිපාදනයන් මෙහි පහත ඇතුළත් කරන ලද යම් කාඩ්පත් ගනුදෙනුවක්, කාඩ්පත් දරන්නන්ගේ සහ ඕනෑම පරිපූරක කාඩ්පත/කාඩ්පත් දරන්නෙකුගේ/දරන්නන්ගේ ඕනෑම වගකීමක් සම්බන්ධයෙන් කාඩ්පත දරන්නාට සහ යම් පරිපූරක කාඩ්පත/කාඩ්පත් දරන්නෙකුට/දරන්නන්ට එරෙහිව බලපැවැත්වෙන පරිදි අඛණ්ඩව බලාත්මකව පවතිනු ඇත.

23.2 මෙම එක් එක් කොන්දේසි සහ නියමයන් එකිනෙකට විභේද්‍ය සහ වෙන් වෙන්ව පැවතිය යුතු අතර, යම් හෙයකින් ඕනෑම අවස්ථාවක එවැනි කොන්දේසි සහ නියමයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් බලරහිත, නීතිවිරෝධී හෝ ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයට පත්වුවහොත් එමගින් ඉතිරි ප්‍රතිපාදනයන්හි වලංගුභාවය, නීත්‍යානුකූලභාවය හෝ ක්‍රියාත්මක කළහැකි බව කිසිඳු ආකාරයකින් බලනොපැවැත්විය යුතු ය.

බැංකුවේ තනි අභිමතය මත මෙම ගිවිසුමේ දැක්වෙන කොන්දේසි සහ නියමයන් සංශෝධනය කිරීමේ අයිතිය බැංකුව සතුව තබාගනී.

24. මුදල් අත්තිකාරම්

24.1 ණයවර කාඩ්පත් දරන්නන් විසින් ඒවා භාවිතා කරමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවලින් (ඒටීඑම්) හෝ බැංකුවේ ශාඛාවලින් හෝ මුදල් ගෙවනු ලබන වෙළෙන්දන් හෝ නියෝජිතයින්ගෙන් ලබාගන්නා මුදල් අත්තිකාරම් එකී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයට (ඒටීඑම්), බැංකුවට, වෙළෙන්දාට, නියෝජිතයාට හෝ රටට අදාල සීමාවන්ට සහ පරිසීමාවන්ට යටත් වේ. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිද අදාල වනු ඇත.

24.2 කාඩ්පත දරන්නා විසින් මුදල් අත්තිකාරම් ලබාගත යුත්තේ ඉහත සඳහන් කළ සීමාව දක්වා පමණක් වන අතර, එවැනි සීමාවන් කාඩ්පත දරන්නා වෙත දැනුම්දිය යුතුද නැත්ද යන්න බැංකුව විසින් තීරණය කරනු ඇත.

24.3 කාඩ්පත දරන්නා වෙත පූර්ව දැනුම්දීමක් නොකර බැංකුව විසින් මෙම පහසුකම ඉවත් කළ හැකි ය.

25. නීතිය සහ අධිකරණ බලය

මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීතියට අනුකූලව පාලනය කරනු ඇති අතර, ඒ අනුව තේරුම් ගත යුතු ය. මෙම කොන්දිසි සහ නියමයන් නීති ප්‍රකාරව, රජයේ රෙගුලාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන උපදෙස්වලට අනුකූලව සංශෝධනය කිරීමට අවශ්‍යතාවයක් පැන නැගුනහොත් එය ස්වයංක්‍රීයව සිදු කෙරෙනු ඇත.

26. කාඩ්පත නිකුත් කිරීමේ කාර්යය සහ එය භාවිතා කිරීම

කාඩ්පත සහ කාඩ්පත් ගිණුම භාවිතා කළ යුත්තේ වලංගු සහ නීත්‍යානුකූල කාර්යයන් සඳහා පමණි. කාඩ්පත හෝ කාඩ්පත් ගිණුම කාඩ්පත දරන්නා විසින් වෙනත් කාර්යයක් පිණිස භාවිතා කරන්නේ නම් හෝ එසේ භාවිතා කිරීමට වෙනත් පුද්ගලයෙකුට ඉඩ දෙන්නේ නම්, එවැනි භාවිතා කිරීමක් වෙනුවෙන් වගකීම කාඩ්පත දරන්නා විසින් දැරිය යුතු ය. ණයවර කාඩ්පතක් ක්‍රියාවෙහි යෙදවීමට අදාලව බැංකුව සහ ජාත්‍යන්තර වීසා (VISA International) හෝ යම් වෙනත් ආයතනයක් සමඟ ගිවිසුමකට ඇතුළත් වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුව විසින් ජාත්‍යන්තර වීසා (VISA International) හෝ යම් වෙනත් ආයතනට ගෙවනු ලබන සියලුම මුදල් හෝ වියදම් කාඩ්පත දරන්නා විසින් බැංකුවට ප්‍රතිපූරණය කළ යුතු ය.

27. බැහැර කිරීම් සහ කාලාවරෝධය

කාඩ්පත් ගිණුමෙහි යම්තාක් හිඟව පවතින සහ බැංකුවට ගෙවිය යුතු යම් මුදල් ගණනක් හෝ එයින් කොටසක් එහෙත් කාඩ්පත දරන්නා/දරන්නන් විසින් බැංකුවට ඒ වනවිටත් නොගෙවා ඇති මුදල්, කාඩ්පත දරන්නාගේ/දරනන්නන්ගේ වගකීම් සහ අපගෙන් එක් එක් කෙනා විසින් එය ගෙවීමට යැපෙන අතර, ඉහතකී පරිදි බැංකුවට හිඟව පවතින මුදල් හෝ එයින් කොටසක් හෝ ඔවුන්ගෙන් අයකර ගත යුතු බැවින්එය කාඩ්පත දරන්නාගේ/දරන්නන්ගේ වගකීම් සහ ඒ ඒ කාඩ්පත දරන්නාගේ එක්ව සහ වෙන් වෙන්ව හෝ වෙන වෙනම තිබෙන වගකීම් වේ. එතෙකුදු වුවත් මෙහි දැක්වෙන කිසිඳු කරුණකට හෝ නීතියේ ඕනෑම ප්‍රතිපාදනයක් හෝ යුක්ති යුක්තභාවයට හෝ කාලාවරෝධී ආඥා පනතට හෝ යම් වෙනත් ආඥා පනතකට හෝ රජයේ රෙගුලාසිවලට පටහැනි නොවී සහ මෙහි සඳහන් මුදල් හෝ එයින් කොටසක්වත් කාඩ්පත දරන්නාගෙන්/දරන්නන්ගෙන් අයකර ගැනීම පිණිස බැංකුව විසින් කාඩ්පත දරන්නාට/දරන්නන්ට විරුද්ධව නඩු පැවරීම වළක්වනු ලබන කාලාවරෝධී පනත යටතේ හෝ එහි යම් ප්‍රතිපාදනයක් යටතේ හෝ ආඥාපනක් යටතේ යම් නීතියක් යටතේ හෝ වෙනත් නීතියක් යටතේ හෝ ආයාචනය නොකරන බවට කාඩ්පත දරන්නා/දරන්නන් තවදුරටත් මෙයින් එකඟ වේ.

28. 1% කැෂ්-බැක් (ණයවර කාඩ්පතක් ගැනීමේදී ගැනුම්කරුට ආපසු ලැබෙන මුදල)ණයවර කාඩ්පත් ප්‍රදානයට අදාල කොන්දේසි සහ නියමයන්

28.1 **ඩීඑෆ්සීසී බැංකුවේ ණයවර කාඩ්පත්** සඳහා කැෂ්-බැක් **ප්‍රදානය** මගින් කාඩ්පත දරන්නා විසින් ඩීඑෆ්සීසී බැංකුවේ කැෂ්-බැක් ණයවර කාඩ්පත් විශේෂ කොන්දේසි සහ නියමයන් පිළිගැනීමට යටත්ව,කාඩ්පත දරන්නා විසින් ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීම මත බැංකුවේ අභිමතය පරිදි බැංකුව විසින් තීරණය කරනු ලබන මුදල් ඉතිරිකිරීම් කාඩ්පත දරන්නා විසින් බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමකට ලබාගැනීමට කාඩ්පත දරන්නා වෙත ඉඩ සලසනු ලබයි.

28.2 කැෂ්-බැක් සඳහා යෝග්‍යතා උපමානය, ඩීඑෆ්සීසී බැංකුවේ ක්‍රියාකාරී ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන යනු ලබන ආයතනික ණයවර කාඩ්පත් (Corporate Credit Card) හැර ඩීඑෆ්සීසී වීසා ප්‍රාථමික ණයවර කාඩ්පත් ලබාගන්නා කාඩ්පත දරන්නා සඳහා විවෘතව පවතින අතර, ඒ සඳහා ඕනෑම වෙළඳආයතනයකදී වියදම් කරනු ලබන මුදලින් 1% ක ප්‍රමාණයක් කැෂ්-බැක් වශයෙන් හිමිකම් කියනු ඇත. එතෙකුදු වුවත්, මේ

සඳහා ඩීඑෆ්සීසී ණයවර කාඩ්පත සක්‍රිය කිරීමත් සමඟ කාඩ්පත දරන්නා විසින් මාසික ගිණුම් ප්‍රකාශ කාලපරිච්ඡේදයක් තුළ රු. 5,000/- අවම සමුච්චිත මුදලක් වියදම් කළ යුතු ය.

28.3 **ණයවර කාඩ්පත්** සඳහා කැෂ්-බැක් **ප්‍රදානය** සඳහා මෙහි දක්වා ඇති ගණුදෙනු සුදුසුකම් නොලබනු ඇත. ඉහත 7 හි අර්ථ දක්වා ඇති ශේෂ පැවරුම් ප්‍රත්‍යාවර්තී/වාරික ගෙවීම්, බැංකු ගාස්තු සහ ගාස්තු ගෙවීම් සහ දේශියව, විදේශීයව හෝ මාර්ගගතව සිදුකරනු ලබන කැසිනෝ හෝ සූදු ගනුදෙනු.

28.4 කාඩ්පත දරන්නා විසින් බැංකුව වෙත දෙනු ලබන ලිඛිත උපදෙස් මගින් කාඩ්පත දරන්නාටම අයත් ඩීඑෆ්සීසී ඉතිරි කිරීමේ ගිණුම හෝ ඔහුගේ/ඇයගේ දරුවාගේ ඩීඑෆ්සීසී කණිෂ්ඨ ඉතිරි කිරීමේ ගිණුම නම් කළ යුතු ය.

28.5 මාසිකව, ත්‍රෛමාසිකව හෝ වාර්ෂිකව වශයෙන් තෝරාගත හැකි කැෂ්-බැක් ඉතිරි කිරීමේ ගිණුමට බැර කිරීමේ වාර ගණන කාඩ්පත දරන්නා විසින් නියම වශයෙන් සඳහන් කළ යුතු ය.

28.6 සුදුසුකම්ලත් පරිපූරක කාඩ්පත් දරන්නන් විසින් උපයාගෙන ඇති කැෂ්-බැක්/වට්ටම් ලබාදීම ප්‍රාථමික කාඩ්පත් දරන්නාගේ ගිණුමට බැර කළ යුතු ය.

28.7 කාඩ්පත් දරන්නන් විසින් එක් ලිත් මාසයක් තුළ උපයාගෙන ඇති මුළු කැෂ්-බැක්/වට්ටම් ලබාදීම, ඊළඟ/අනුයාත ලිත් මාසයේ අග වනවිට නම් කරන ලද ඩීඑෆ්සීසී ඉතිරි කිරීමේ ගිණුමකට ඇතුළත් කරනු ඇති අතර, ඉදින් අවම වශයෙන් රු. 100/- ක කැෂ්-බැක් ගණනක් උපයා ඇතිවිට කැෂ්-බැක් විස්තර දක්වමින් කෙටි පණිවිඩයක් කාඩ්පත දරන්නා වෙත යවනු ඇත. උපයාගෙන ඇති කැෂ්-බැක් ගණන, කාඩ්පත දරන්නාගේ තදනන්තර ණයවර කාඩ්පත් ගිණුම් ප්‍රකාශයේ දක්වනු ඇත.

28.8 ඉහත 28.7 ඡේදයේ දක්වා ඇති පරිදි කැෂ්-බැක්/වට්ටම් ලබාදීම බැර කරනු ලබන අවස්ථාවේදී සුදුසකම් ලබන කාඩ්පත දරන්නාගේ ණයවර කාඩ්පත් ගිණුම ඩීඑෆ්සීසී බැංකුවේ තනි අභිමතය මත තීරණය කර ඇති පරිදි හොඳ ස්ථාවරයකින් සහ විධිමත් සතුටුදායක ආකාරයකින් පරිහරණය කරමින් තිබිය යුතු ය.කැෂ්-බැක්/වට්ටම් ලබාදීම අදාල ගිණුමට බැර කිරීමට පෙර අදාල ගිණුම යුතුකම් පැහැර හරිමින් හෝ ස්වෙච්ඡාවෙන් හෝ නිරායාසයෙන් වසා දමා ඇති හෝ අවසන් කර ඇති හෝ ඕනෑම හේතුවක් නිසා අත්හිටුවා ඇති අවස්ථාවක එකී කැෂ්-බැක්/වට්ටම් ලබාදීම බැර නොකර සිටීමේ අයිතිය බැංකුව සතු ය.

28.9 ගිණුමකට බැරකළ යුතු කැෂ්-බැක් මුදල දශම දෙකකට වට කරනු ඇත.

28.10 යම් ආරවුල්සහගත,ි ප්‍රතිවර්තිත/මුදල් ආපසුදීමක් හෝ අවලංගු කරන ලද/බලරහිත ගනුදෙනුවක් කැෂ්-බැක් ණයවර කාඩ්පත් ප්‍රදානය ලබාගත ගැනීමට සුදුසුකම්ලත් ගනුදෙනුවක් නොවනු ඇත.

28.11 **ණයවර කාඩ්පත්** සඳහා කැෂ්-බැක් **ප්‍රදානය**ට අදාල කොන්දේසි සහ නියමයන් කාඩ්පත් දරන්නාගේ ගිවිසුමෙහි දැක්වෙන කොන්දේසි සහ නියමයන්ට අමතර ඒවා වන අතර එමගින් එකී ගිවිසුමෙහි සඳහන් කොන්දේසි සහ නියමයන්ගේ අගය අඩුවීමක් සිදුනොවේ.

28.12 මෙම **ණයවර කාඩ්පත්** සඳහා කැෂ්-බැක් **ප්‍රදානය**, කාඩ්පත දරන්නා වෙත ලබාදෙන විශේෂ පහසුකමක් වන අතර, ඒ හේතුකොට ගෙන කාඩ්පත දරන්නාගේ ගිණුමෙහි දැක්වෙන කොන්දේසි සහ නියමයන්ට අගතියක් හෝ බලපෑමක් ඇතිනොවිය යුතු ය.

28.13 මෙම **ණයවර කාඩ්පත්** සඳහා කැෂ්-බැක් **ප්‍රදානය** සම්බන්ධයෙන් හටගන්නා ආරවුල්ද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී ඊට අදාල සියලු කරුණු සම්බන්ධයෙන් බැංකුව විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වන අතර, මෙම කැෂ්-බැක් ණයවර කාඩ්පත් ප්‍රදානයේ සියලුම කාඩ්පත් දරන්නන් එයින් බැඳේ.

28.14 කාඩ්පත් දරන්නන් වෙත පූර්ව දැනුම්දීමක් රහිතව **ණයවර කාඩ්පත්** සඳහා කැෂ්-බැක් **ප්‍රදානය** යටතේ සුදුකම් ලබන ගනුදෙනු වර්ග සහ හෝ කැෂ්-බැක්/මුදල් ආපසු දීමේ කාණ්ඩ වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතු ය.

28.15 **ණයවර කාඩ්පත්** සඳහා කැෂ්-බැක් **ප්‍රදානය**ට අදාලව මෙහි අඩංගු වන කොන්දේසි සහ නියමයන්ගෙන් ඕනෑම එකක් කාඩ්පත් දරන්නන් වෙත පූර්ව දැනුම්දීමක් නොකර ඕනෑම අවස්ථාවක වෙනස් කිරීමේ අයිතිය බැංකුවට තිබිය යුතු අතර, එසේ වෙනස්කම සිදුකළා යැයි පවසනු ලබන දින සිට ඒ සඳහා කාඩ්පත් දරන්නන් නිසැකවම බැඳේ. එතෙකුවු වුවත්, සිදුකරනු ලබන එවැනි වෙනස් කිරීමක් ලිපි මාර්ගයෙන් සහ/හෝ දේශීය පුවත්පත්වල දැන්වීම් පලකිරීමෙන් සහ/හෝ බැංකුවේ දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීමෙන් සහ/හෝ ගිණුම් ප්‍රකාශ ඔස්සේ කාඩ්පත් දරන්නන් වෙත සන්නිවේදනය කරනු ඇත.